# කාර්යසාධන වාර්තාව
# செயற்திறன் அறிக்கை
# Performance Report
# 2023



**අග්‍රාමාත්‍ය කාර්යාලය**
**பிரதம அமைச்சர் அலுவலகம்**
**Prime Minister's Office**



## අග්‍රාමාත්‍ය කාර්යාලය

# 2023 කාර්යසාධන වාර්තාව

**58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත**
**කොළඹ 07**

දුරකථන **:0112575317**
ෆැක්ස් **:0112575310**
විද්‍යුත් ලිපිනය :info@pmoffice.gov.lk
වෙබ් අඩවිය :www.pmoffice.gov.lk

## පටුන


**1. ආයතනික පැතිකඩ ...........................................................................1**

1.1 හැඳින්වීම ........................................................................................ 1

1.2 ආයතනික දැක්ම හා මෙහෙවර ....................................................................... 2

1.3 ප්‍රමුඛතා ........................................................................................ 3

1.4 අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය .................................................... 5

**2. ප්‍රගතිය හා අනාගත දැක්ම ...........................................................6**

2. 1 ලේකම් කාර්යාංශය .............................................................................. 6

2. 2 සංවර්ධන අංශය I ................................................................................ 10

2. 3 සංවර්ධන අංශය II ............................................................................... 15

2. 4 සංවර්ධන අංශය III .............................................................................. 38

2. 5 පාලන අංශය I සහ II ............................................................................. 55

2. 6 ගිණුම් අංශය ..................................................................................... 61

2.7 අභ්‍යන්තර විගණන අංශය ........................................................................... 63

2.8 මාධ්‍ය අංශය ...................................................................................... 65

2. 9 නීති අංශය ....................................................................................... 68

2. 10 මහජන සම්බන්ධතා අංශය ......................................................................... 69

**3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ..................................................74**

3. 1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ........................................................................ 74

3. 2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........................................................................ 75

3. 3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය........................................................................................ 76

**4. ආයතනයේ කාර්යසාධන දර්ශක.................................................................77**

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම අනුව) .................................. 77

**5. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය ..................................89**

5. 1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක ................................ 89

5.2. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා වන ගෝලීය ඉලක්ක හා දර්ශක විස්තරාත්මකව හඳුනාගැනීම ........................................................................... 98

**6. මානව සම්පත් පැතිකඩ ...........................................................................104**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........................................................................ 104

6.2 සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්ය සාධනයට ...................... 104

6.3 මානව සම්පත් සංවර්ධනය.............................................................................. 105

**7. අනුකූලතා වාර්තාව ...............................................................................110**

7.1. අනුකූලතා වාර්තාව........................................................................................ 110

**8. විගණකාධිපති නිරීක්ෂණ.........................................................................118**

8. 1 විගණකාධිපති නිරීක්ෂණ ............................................................................... 118

# 01

# ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යවරයාගේ නිල වගකීම් ක්‍රියාත්මක කිරීම අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ඉටු කරනු ලබයි. අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ හා අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතාගේ මෙහෙයවීම මත රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ආර්ථික හා සමාජීය සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා අනෙකුත් රාජ්‍ය අංශයන් වෙත අවශ්‍ය නායකත්වයන් හා මඟ පෙන්වීම් සිදු කිරීම හා සම්බන්ධීකරණය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ. එමෙන්ම වර්ෂ 2048 දී තිරසරව සංවර්ධිත රටක් වෙනුවෙන් වන රජයේ සංවර්ධන ඉලක්කගත කාර්යභාරය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වය සැපයීම, අමාත්‍ය මණ්ඩලය විසින් විටින් විට විවිධ විෂය පථයන් යටතේ අමාත්‍ය මණ්ඩල කමිටු හා නිලධාරී මට්ටමේ කමිටු වල සභාපතීත්වයන් දරමින් අදාළ වගකීම් ඉටු කිරීම, කාලීන අභියෝග සඳහා කඩිනමින් පිළියම් යෙදීම හා ජනතා අපේක්ෂාවන් සඵල වන ආකාරයට රාජ්‍ය සේවය ශක්තිමත් හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය නායකත්වය සැපයීම අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් කාර්යක්ෂමව සිදු කරනු ලබයි.

ජාත්‍යන්තර සහයෝගිතාවන් ශක්තිමත් කිරීම, වෙළඳ ආයෝජන අවස්ථා රටට ආකර්ෂණය කර ගැනීම, සංස්කෘතික සබඳතා සවිමත් කරගැනීම යනාදීයන් උදෙසා විටින්විට විදේශ දූත මණ්ඩල සහ නිල සංචාර මඟින් තරකර ගැනීම, මෙරට සංවර්ධන පාර්ශවකරුවන් හා ජාත්‍යන්තර සංවර්ධන හා උපායමාර්ගික පාර්ශවකරුවන් අතර සබඳතා තහවුරු කිරීම සඳහා අවශ්‍ය නායකත්වය ලබා දීමද අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්යභාරයක් ලෙස අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

## 1.2 ආයතනික දැක්ම හා මෙහෙවර

**දැක්ම**

"ස්වාධීන, ස්වෛරී හා සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්"

**මෙහෙවර**

"ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම පිණිසත්, ජීවන තත්ත්වයන් නංවාලීම පිණිසත් රාජ්‍ය, පෞද්ගලික විදේශ දූත මණ්ඩල, එක්සත් ජාතීන් හා රාජ්‍ය නොවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් විශිෂ්ට රාජ්‍ය යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වය සැපයීම"

## 1.3 ප්‍රමුඛතා

- රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීම සඳහා සියළු අමාත්‍යාංශ හා ආයතන පද්ධති වෙත අවශ්‍ය මඟපෙන්වීම් නිරන්තරව ලබාදීම

- ජාතික ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවැසි පියවර ගැනීම හා නව මැදිහත්වීම් සිදු කිරීම

- සමාජ, ආර්ථික, සංවර්ධන විෂයෙහි පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ සෘජු මැදිහත්වීම් අවස්ථානුකූලව සිදු කිරීම

- ගරු අග්‍රාමාත්‍යවරයාගේ මූලිකත්වයෙන් පවත්වන විවිධ කමිටු හා සාකච්ඡා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ඊට අදාළ ප්‍රගතිය පසුවිපරම් කිරීම

- ගරු අග්‍රාමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී විමසනු ලබන ප්‍රශ්නවලට කඩිනමින් පිළිතුරු සැකසීම

- ගරු අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්වලට අදාළ සියළු කටයුතු සම්බන්ධීකරණය කිරීම

- ගරු අග්‍රාමාත්‍යවරයාට රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පැවැත්වීමට සහ ඒවා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය

- ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන මහජන පැමිණිලි හා දුක්ගැනවිලි, අදාළ ආයතන වෙත යොමු කර නිසි පසුවිපරම් සිදු කරමින් සහන සැලසීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම

- ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සම්බන්ධීකරණය, මෙහෙයවීම හා ඒ පිළිබඳ මාධ්‍ය මඟින් දැනුවත් කිරීම

- අග්‍රාමාත්‍ය ලේකම්වරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ප්‍රගතිය පසු විපරම් කිරීම

- අමාත්‍ය මණ්ඩලය විසින් ගරු අග්‍රාමාත්‍යවරයා සභාපතිවරයා ලෙස පත් කරමින් පිහිටුවන ලබන නිල අමාත්‍ය මණ්ඩල අනු කමිටුවලට අදාළ රාජකාරිමය වගකීම් ඉටු කිරීම

- ජනාධිපති ලේකම් කාර්යාලය සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලය සමඟ මනා සම්බන්ධීකරණය

- පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය සහ ආණ්ඩු පක්ෂ සංවිධායක කාර්යාලය සමඟ නිරන්තර සම්බන්ධීකරණය

- අග්‍රාමාත්‍ය කාර්යාලය ජාතික මට්ටමේ ඇගයීම් වලට යොමු කරමින් ජාතික සම්මාන ලබා ගැනීම් පිළිවෙලින් 2015, 2016, 2017, 2018, 2019 හා 2020 වසර වල අඛණ්ඩව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) විසින් රාජ්‍ය ආයතන 1400ක් පමණ අතුරින් ලබාදෙන ඉහළම සම්මානය වන රන් සම්මානය හිමි කරගැනීම හා 2023 වර්ෂය සඳහා ද අදාළ සම්මානය හිමි කරගැනීම පිණිස අවශ්‍ය වන ප්‍රශස්ථ මූල්‍ය කළමනාකාරීත්වයන් සිදු කිරීම

- ජාතික හා ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් රාජ්‍ය අනුග්‍රහය සහිතව සංවිධානය කිරීම

- අග්‍රාමාත්‍ය කාර්යාලය, අරලියගහ මන්දිරය සහ අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාස පරිශ්‍ර නිසි පරිදි නඩත්තු කර පවත්වාගෙන යා

## 1.4 අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය




- සේ.සේ.වෘ.ස - සේව්‍ය - සේවක වෘත්තීය සබඳතා
- ප්‍රධාන අභ්‍ය. විගණක - ප්‍රධාන අභ්‍යන්තර විගණක
- නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
- ස.අ. - සහකාර අධ්‍යක්ෂ
- ලේ.කා. - ලේකම් කාර්යාංශය
- මහ.සම්. - මහජන සම්බන්ධතා
- තො.ස.තා. - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ

# 02

# ප්‍රගතිය හා අනාගත දැක්ම

## 2.1 ලේකම් කාර්යාංශය

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් විටින්විට අග්‍රාමාත්‍ය ලේකම් වෙත ලබා දෙන උපදෙස් හා නියෝග මෙන්ම අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් සෘජුවම අංශ ප්‍රධානීන් වෙත හා සමස්ත කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන නියෝග අග්‍රාමාත්‍ය කාර්යාලයීය සංවිධාන ධූරාවලියේ ඉහළ සිට පහළට (සිරස්) හා අංශ අතර (තිරස්) සන්නිවේදනය මගින් තිරසරව ක්‍රියාත්මක කිරීම හා සියලුම අංශ අතර සම්බන්ධීකරණය මෙම කාර්යාංශය මඟින් සිදු කරනු ලබයි.

### 2.1.1 ලේකම් කාර්යාංශය මඟින් ඉටු කරන කාර්යයන්

1. එක් එක් අංශ වෙත පවරා ඇති වගකීම්වලට අදාළ ඉලක්ක ප්‍රශස්තව සපුරා ඇත්ද යන්න අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය.
2. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ව්‍යවස්ථාපිතමය වශයෙන් පැවරෙන රාජකාරි ඉටුකිරීමට අවශ්‍ය සෘජු හා වක්‍ර පැවරුම් ක්‍රියාත්මක කිරීම.
3. ජනාධිපති කාර්යාලය, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, මහා භාණ්ඩාගාරය, ජාතික විගණන කාර්යාලය ඇතුලත්ව සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ආදී බාහිර රාජ්‍ය ආයතන සඳහා කේන්ද්‍රීය සම්බන්ධතා ඒකකයක් වශයෙන් ක්‍රියා කිරීම.
4. දැනට පවත්නා ක්‍රමවේදයන් වඩා නිරවද්‍ය හා පාරදෘශ්‍ය ක්‍රමවේදයන් බවට පත් කිරීමත්, කාර්යක්ෂම හා වඩා ඵලදායී යාන්ත්‍රණයක් සඳහා අවශ්‍ය නව තාක්ෂණික දැනුම හා AAA, BPR වැනි මෙවලම් යොදා ගනිමින් කාර්යාල ක්‍රමවේද නව්‍යකරණයකට ලක් කරමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම.
5. අභ්‍යන්තර විගණන අංශය, නීති අංශය හා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දෙනු ලබන තවදුරටත් අනුගත විය යුතු නෛතිකමය ප්‍රතිපාදන, රෙගුලාසි කෙරෙහි අවධානය යොමු කරමින් යහපාලන සිද්ධාන්තයන් ප්‍රායෝගික තලයකට ගෙන ඒම සඳහා වඩා නිරවද්‍ය ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.

6. ගරු අග්‍රාමාත්‍යතුමා සහ අග්‍රාමාත්‍ය ලේකම්වරයා හා රාජ්‍ය තාන්ත්‍රික /විදේශීය ප්‍රභූවරුන් සමග පවත්වන සාකච්ඡා/ හමුවීම් සම්බන්ධීකරණය.

7. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතු පහත සඳහන් කමිටුවල ක්‍රියාකාරීත්වය සඳහා අදාළ ආයතන සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ අංශ සමඟ නිසි සම්බන්ධීකරණය හා අවශ්‍ය අවස්ථාවන්හිදී කමිටු වාර්තා සැකසීම

- ආහාර සුරක්ෂිතතා කඩිනම් ජාතික මෙහෙයුම ( ධීවර හා පශු සම්පත් ජාතික කමිටුව)
- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ජාතික මෙහෙයුම් මැදිරිය (National Operation Room)
- රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම
- අධික ලෙස මිල උද්ධමනය පවතින දේශීය වෙළඳපලේ බිත්තර මිල ස්ථායිකරණය කිරීම පිණිස පත්කළ අමාත්‍ය මණ්ඩල කමිටුව
- වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සමාලෝචනය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුව
- ඊ - මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුව
- මහනුවර නගරය විධිමත්ව සංවර්ධනය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුව
- ශ්‍රී ලංකාවේ ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව
- ජාතික කවුන්සිලයේ කෙටි කාලීන මධ්‍ය කාලීන සහ දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සැකසීමේ ප්‍රමුකතා හඳුනා ගැනීම සඳහා පත් කරන ලද අනු කමිටුව
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තාක්ෂණික විශේෂඥ කමිටුව (ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය)
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වූ අධීක්ෂණ කමිටුව සම්බන්ධව කැබිනට් මණ්ඩලය විසින් පත්කළ කමිටුව
- ශ්‍රී ලංකාව සඳහා ජාතික ඩිජිටල් ආර්ථික උපාය මාර්ග සංවර්ධනය පිළිබඳ කැබිනට් මණ්ඩලය පත්කළ කමිටුව
- ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පිළිගත් විශ්ව විද්‍යාලවල වෛද්‍ය උපාධි පාඨමාලා පිළිගැනීම සහ වර්තමාන අවශ්‍යතාවලට සරිලන පරිදි වෛද්‍ය ආඥා පනතේ විධිවිධාන සංශෝධනය කිරීම මත පදනම් වූ ප්‍රමිති සහ නිර්ණායක සහිත ජාතික ප්‍රතිපත්තිය

- සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් ජනසම්මතවාදී පාලනයක් සහතික කිරීම උදෙසා ජනසභා ක්‍රමය ස්ථාපිත කිරීමේ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවට සහය වීම පිණිස ජ්‍යෝෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත නිලධාරී කමිටුව
- කොළඹ කොටුව-මාළඹේ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විකල්ප යෝජනාවක් ලබා ගැනීම පිළිබඳ නිලධාරී කමිටුව
- අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කළ ජාතික සම්මාන ප්‍රධාන තේරීම් කමිටුව -2023
- රජය සතු ව්‍යවසායයන්හි අයිතිය බැහැර කිරීම - අමාත්‍ය මණ්ඩලය විසින් විශේෂ සාකච්ඡා කමිටුවක් සහ විශේෂ ව්‍යාපෘති කමිටු පත් කිරීම
- වන විනාශය වැලැක්වීම, අනවසර වැලි ගොඩදැමීම සහ පරිසර ආරක්ෂණය පිළිබඳ කාරක සභාව
- මාර්ගගත ක්‍රමය ඔස්සේ විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම දිවයින පුරා ව්‍යාප්ත කිරීම හැඳුනුම්පත් කළමනාකරණ ක්‍රියාවලියට ජෛවමිතික දත්තයන් ඇතුලත් කිරීම සහ e – NIC ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම ආශ්‍රිත නිර්දේශ ලබාදීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුව

8. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන්/ සාමාජිකත්වයෙන් හා /හෝ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සාමාජිකත්වයෙන් යුතු පහත සඳහන් කමිටුවල ක්‍රියාකාරීත්වය සඳහා අදාළ ආයතන සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ අංශ සමඟ නිසි සම්බන්ධීකරණය

- බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග (අමාත්‍ය මණ්ඩල අනුකමිටුව)
- බස්නාහිර ප්‍රදේශ මහනගර ප්‍රධාන සැලැස්ම-2048 ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කිරීම, ආයතනික සම්බන්ධීකරණය සහ මඟ පෙන්වීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව
- ආර්ථික පුනර්ජීවනය සහ වර්ධනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව
- තෝරාගත් බස් රථ සහ වාණිජ වාහන ආනයනය කිරීමේදී දැනට ක්‍රියාත්මක තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සම්බන්ධයෙන් පත් කළ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව
- පළාත් පාලන ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම වෙනුවෙන් සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා වන කමිටුව

- ආහාර ප්‍රතිපත්ති කමිටුව
- සංහිඳියාව පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව පිහිටුවීම
- කොවිඩ් - 19 සහ ඩෙංගු රෝග රට තුළ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අදාළ පාර්ශවයන් වෙත මඟ පෙන්වීම සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් තීරණයන්ට එළැඹීම පිණිස පත් කරන ලද අමාත්‍ය මණ්ඩල කමිටුව
- සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් ජනසම්මතවාදී පාලනයක් සහතික කිරීම උදෙසා ජනසභා ක්‍රමය ස්ථාපිත කිරීමේ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව
- ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (කඩිනම් ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන)
- විශ්‍රාමික අගවිනිසුරුවරුන්ගේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් විනිසුරුවරුන්ගේ පරිවර්තිත පාරිතෝෂිකය ගෙවීම සහ අයකර ගැනීම පිළිබඳ කැබිනට් අනුකාරක සභාව - ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC (FR) 282/2018
- බිල් ඇන්ඩ් මෙලින්ඩා ගේට්ස් පදනම (Bill and Melinda Gates Foundation - BMGF) විසින් සහාය දක්වන ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘති සඳහා පත් කරන ලද විධායක කමිටුව

9. අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත සෘජුවම යොමුවන විද්‍යුත් තැපැල, WhatsApp පණිවුඩ, ෆැක්ස් පණිවුඩ හා ලිපි කෙරෙහි කඩිනම් ප්‍රතිචාර දැක්වීම හා අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ප්‍රතිපෝෂණ ලබා ගැනීම, ප්‍රගතිය විමසීම.

10. අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ පවතින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හා අනුබද්ධිත CITRA Social Innovation Lab හි නව තාක්ෂණික හා විශේෂඥ දැනුම, නව්‍ය ප්‍රවේශ හරහා යොදා ගනිමින් එක් එක් මානයන් ඔස්සේ විවිධ ක්ෂේත්‍රයන්හි ඩිජිටල් පරිවර්තන මුලපිරීම්වල සිට දත්ත මත පදනම් වූ සුවිධානාත්මක තීරණ ගැනීම හා අඛණ්ඩ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා වඩාත් වේගවත් සහ ඵලදායී රාජ්‍ය යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීමට හා මාර්ගෝපදේශ සකස් කිරීමට පියවර ගැනීම.

## 2.2 සංවර්ධන අංශය I

### 2.2.1 සංවර්ධන I අංශය මඟින් ඉටුකළ විශේෂ කාර්යයන්

01.

**ඉදිරි දශකය (2023-2033) ඉලක්ක කරගත් ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායන් හා මාර්ග සිතියම සැකසීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකමිටුව**



වර්තමානයේ බලශක්ති ක්ෂේත්‍රය මුහුණ දෙන විවිධ අභියෝග හඳුනා ගනිමින් හා රටේ ආර්ථික සංවර්ධනය උදෙසා බලශක්තිය වඩාත් ප්‍රශස්තව පරිහරණය කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ඉලක්කගත මාර්ග සිතියමක් සකස් කර ගැනීමේ කාලීන අවශ්‍යතාවය සපුරලනුවස්, ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් සහ ගරු අමාත්‍යවරුන් සයදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව, 2019.08.09 දිනැති අංක 2135/61 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපාය මාර්ග පාදක කොට, එළැඹෙන දස වර්ෂයක කාලසීමාවක් (2023 – 2033) සඳහා තිරසර බලශක්ති ආරක්ෂණ ක්‍රමෝපායික සැලසුමක් ස්ථාපනය කිරීම මෙහි අපේක්ෂාව විණි. බලශක්ති ක්ෂේත්‍රයට අදාළ රාජ්‍ය ආයතන සහ විෂය ප්‍රාමාණික විද්වතුන්ගේ අදහස්, යෝජනා සහ නිර්දේශ ඇතුළත්ව සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාවෙහි ප්‍රධාන නිර්දේශ 09ක් අන්තර්ගත වන අතර, 2023.01.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී මේ වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව ඊට අදාළ වගකීම් දරන අමාත්‍යාංශ වෙත ක්‍රියාවට නැංවීම පිණිස යොමු කරනු ලැබ ඇත. තවද, ආයතනික බලශක්ති සංරක්ෂණ විගණනය සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් බස්නාහිර පළාතේ බලශක්ති කළමණාකරුවන් 175 ගේ සහභාගීත්වයෙන් ආරම්භක වැඩමුළුවක් පැවැත් වූ අතර, 2024 පළමු කාර්තු 02ක තුළ අනෙක් පළාත් සඳහා ද මෙම වැඩමුළුව ක්‍රියාත්මක කිරීමට නියමිතය. එමෙන්ම, තේ කර්මාන්තශාලා ආශ්‍රිතව බලශක්ති

සංරක්ෂණය පිණිස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය හරහා ඇල්මා සහ අරුණ යන තේ කර්මාන්තශාලාවල බලශක්ති විගණන පරීක්ෂණ ද, බලශක්ති විගණන වාර්තා මඟින් නිර්දේශ කරනු ලබන බලශක්ති සංරක්ෂණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් ද මේ වන විටත් සකස් කර ඇත. දැනට තේ කර්මාන්තශාලාවන්හි ක්‍රියාත්මක යන්ත්‍ර සූත්‍ර සඳහා යොදාගන්නා බලශක්ති විභවයන් හා සංරක්ෂණ ක්‍රමෝපායන් ඇතුලත් මාර්ග සිතියම පිළියෙල කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය හා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය යන ආයතන මඟින් 2024 වර්ෂයේ පළමු කාර්තුව තුළ දී නිම කිරීමට අපේක්ෂිතයි.

## 02.

### මිරිස්ස සමුද්‍රීය කලාපය වනජීවී සමුද්‍රීය අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුකමිටුව



මිරිස්ස සුවිශේෂී සමුද්‍රීය කලාපය වනජීවී සමුද්‍රීය අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අදාළව සියලුම පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් වැඩිදුර අධ්‍යයනයක් සිදු කර නිර්දේශ ඇතුළත් වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් සහ ගරු අමාත්‍යවරුන් සය දෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරනු ලැබ ඇත.මිරිස්ස සමුද්‍රීය කලාපය, වනජීවී සමුද්‍රීය අභයභූමියක් බවට ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව කරන ලද කරුණු අධ්‍යයනයේදී, එම ප්‍රදේශයේ ස්වභාවික සමුද්‍රීය සම්පත් සංරක්ෂණය කිරීම, සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ධීවර කර්මාන්තයේ නියැලී සිටින ජනතාවගේ අභිප්‍රායයන් ආරක්ෂා කිරීම හා මිරිස්ස වෙරළ තීරය ජාත්‍යන්තර නිල් ධජ (BLUE FLAG) වෙරළ කලාපයක් බවට පත් කිරීම මඟින් සංචාරක කර්මාන්තය ආශ්‍රිත නව ප්‍රවර්ධනයක් ඇති කිරීම තුළින් මෙරට විදේශ විනිමය ඉපැයීම් වර්ධනය කර ගැනීම යන කරුණු කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබ ඇත. ප්‍රස්තුත කරුණු මත පදනම්ව එළැඹි නිර්දේශ ඇතුළත් අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තාව ගරු අග්‍රාමාත්‍යවරයා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත

අතර, ඒ අනුව එළැඹෙනු ලබන තීරණ ප්‍රකාරව ඉදිරි කටයුතු සඳහා සංවර්ධන අංශය මැදිහත්වීම මගින් අවශ්‍ය මගපෙන්වීම හා සම්බන්ධීකරණ කටයුතු නිරන්තරයෙන් සිදු කරනු ඇත

## 03.

## ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා වන ජාතික වැඩසටහන



වර්ෂ 2023 සිට 2027 දක්වා වන පස් වසරක කාලය ඉලක්ක කරගනිමින් අබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් රජයෙන් ඉටුකළ යුතු කාර්යයන් සහිත ජාතික සැලැස්මක් සකස් කිරීම අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යනාදී අමාත්‍යාංශයන් හි ලේකම්වරුන් ඇතුළු සියලුම පාර්ශවකාර ආයතනවල ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් සිදුකරනු ලැබ

සකස් කරන ලද "ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා වන ජාතික වැඩසටහන් වාර්තාවේ කෙටුම්පත" පරතර විශ්ලේෂණය (Gap Analysis), ආබාධ සහිත ප්‍රජාව පිළිබඳ යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් සකස් කිරීම හා ආබාධිත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂා කිරීම පිණිස " ස්වාධීන විමර්ශන යාන්ත්‍රණයක්" හඳුන්වා දීම සිදුකළ යුතු බවට වූ නිර්දේශ මේ වනවිට ලබා දී ඇත.

## 2.2 සැලසුම් ඒකකය මඟින් ඉටු කරන ලද කාර්යයන්

**අග්‍රාමාත්‍ය කාර්යාලයීය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

2023 වර්ෂය සඳහා අදාළ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට පෙර සකස් කර ඉදිරිපත් කරනු ලැබ ඇති අතර වසරේ සියලුම කාර්තු සඳහා ක්‍රියාකාරී සැලසුම් කාර්තු වශයෙන් සකස්කර නියමිත කාලවකවානු ඇතුලත ඉදිරිපත්කරනු ලැබ ඇත.

**වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පත හා අවසන් කාර්ය සාධන වාර්තාව සැකසීම**

2002.09.12 දිනැති මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4 ඡේදයෙහි විධිවිධාන අනුව 2022 වර්ෂය හා අදාළ අග්‍රාමාත්‍ය කාර්යාලයීය කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත 2023 පෙබරවාරි 28 පෙර විගණකාධිපති වෙත ද අවසන් කාර්ය සාධන වාර්තාව 2023.05.31 දිනට පෙර පාර්ලිමේන්තුව වෙත ද නියමිත පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇත.

**වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම**

2023 වර්ෂයේ පළමු කාර්තු ත්‍රිත්වය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් හි ප්‍රගතිය ඇතුළත් 2023 වර්ෂය සඳහා ප්‍රගති වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් යුක්තව සකස් කර පාර්ලිමේන්තුවේ අයවැය විවාදයේදී සභාගත කිරීම සඳහා නියමිත දිනට පෙර ඉදිරිපත් කර ඇත.

**අග්‍රාමාත්‍ය කාර්යාලයීය වාර්ෂික සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

කාලීනව පැන නැගුණ විවිධ සංවර්ධන අවශ්‍යතාවයන් හා ආයතනික අවශ්‍යතාවය පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වර්ෂය මැද භාගයේදී සංශෝධනය කරන ලද අතර එම සංශෝධිත ක්‍රියාකාරී සැලස්ම විගණකාධිපති හා අදාළ අනෙකුත් ආයතන වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වර්ෂයේ සියලු කාර්තුමය ප්‍රගති වාර්තා සැකසීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එක් එක් අංශයන් විසින් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් හි ප්‍රගතිය කාර්තුමය වශයෙන් විගණ අංශය වෙත වාර්තා කරනු ලැබ ඇත

**අග්‍රාමාත්‍ය කාර්යාලයීය තිරසර සංවර්ධන අරමුණු (SDG's) ළඟා කර ගැනීමේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම**

වර්ෂ 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව 2023 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම් ප්‍රගති ඇතුලත් වාර්තාව නියමිත පරිදි සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී



# 2.3 සංවර්ධන අංශය II

## 2.3.1 සංවර්ධන II අංශය මඟින් ඉටුකළ විශේෂ කමිටු හා අනු කමිටු සම්බන්ධ කටයුතු

**01.**

**"ජන සභා ක්‍රමය" ස්ථාපිත කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව**



සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් ජනසම්මතවාදී, පාලනයක් ස්ථාපිත කිරීම උදෙසා ජනසභා ක්‍රමය ස්ථාපිත කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් හා ගරු අමාත්‍යවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කර ඇති අතර එම අනු කමිටුවට සහය වීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරි කමිටුවක් ද පත් කර ඇත. සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ සහිතව ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන සංවිධාන ව්‍යුහයක් තුළ රාජ්‍ය නිලධාරින්ට සහ මහජනතාවට එක්ව ග්‍රාමීය ප්‍රශ්න සාකච්ඡා කළ හැකි, ග්‍රාමීය ජනතාවට සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී විය හැකි හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පරිධියේ ජනතාවට සිය අදහස් සක්‍රීය ලෙස ලබා දිය හැකි යාන්ත්‍රණයක් ලෙස "ජනසභා ක්‍රමය"ඇති කිරීම සඳහා වන සංකල්ප පත්‍රිකාව, සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ මූලිකත්වයෙන් ඉදිරිපත් කර ඇත. එකී සංකල්ප පත්‍රිකාව මඟින් දිවයිනේ සෑම ග්‍රාම නිලධාරි වසමක් ම ආවරණය වන පරිදි "ග්‍රාමීය ජනසභා" පිහිටුවීමටත්, ජාතික මට්ටමින් "ජාතික ජනසභාව" පිහිටුවීමටත් යෝජනා කරනු ලැබ තිබේ. එමඟින් යෝජිත "ජනසභා ක්‍රමය" රජය විසින් මූලික ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගැනීමටත්, "ජනසභා ක්‍රමය" ස්ථාපිත කිරීම සඳහා වන ජාතික මට්ටමේ ස්වාධීන කේන්ද්‍රී ආයතනය ලෙස "ජාතික ජනසභා ලේකම් කාර්යාලය" ස්ථාපිත කිරීමටත් ගරු ජනාධිපතිව

ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති අතර අමාත්‍යමණ්ඩල අනු කමිටුව විසින් අදාළ ක්‍රියාපටිපාටීන් පිළිබඳව සමාලෝචනයට ලක් කෙරෙමින් පවතී.

## 02.

## ජාතික සමූපකාර ව්‍යාපාර හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යූහගතකරණය කිරීමේ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව



“

ජාතික සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යූහගත කිරීම” යන තේමාව අනුව මෙරට සමූපකාර ව්‍යාපාර කඩිනමින් ප්‍රතිව්‍යූහගතකරණය කළ යුතු ආකාරය පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ සහිත සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යවරයා සභාපතිත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරන ලදී. සමූපකාර ව්‍යාපාර වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කරනු ලබන රටවල් විසින් ඒ සඳහා අනුගමනය කරනු ලැබ ඇති ක්‍රමවේදයන් පිළිබඳව හා මහජන අවශ්‍යතා ඉටු කිරීම පිණිස රජයේ අවම මැදිහත් වීම මත විශිෂ්ට වෙළෙඳපොළ හවුල්කරුවෙකු බවට පත් වීම සඳහා අවශ්‍ය වන නිර්දේශ ලබා දීම මෙහිදී අරමුණු කොට ඇත. පළමු කමිටු රැස්වීම අරලියගහ මන්දිරයේ දී 2023.10.23 දින පැවැත්වූ අතර එහිදී සමූපකාර ප්‍රතිව්‍යූහගතකරණය කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සටහන හා තීරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ ඉන් අපේක්ෂිත ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව ගරු ආණ්ඩුකාරවරුන් දැනුවත් කිරීමටත් අදහස් විමසීමටත් Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය විණි.



## 03.

**දේශගුණික විපර්යාස වලට අනුගතවන අයුරින් ජල සම්පතෙහි තිරසර සංවර්ධනය උදෙසා "ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය" එළිදැක්වීම**

දේශගුණික විපර්යාස තත්ත්වයන් හමුවේ සිදු වෙමින් පවතින සංවහන වැසි රටාවල සීඝ්‍ර වෙනස්වීම් වලට අනුගත වෙමින් අපසතු සීමිත ජලසම්පත්වල ප්‍රශස්ථ භාවිතාවන් සහ අනාගත පරපුරේ අවශ්‍යතා සපුරාලීම පිණිස සංරක්ෂණය කරමින් නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා, ජල සම්පතෙහි තිරසර සංවර්ධනය සුරක්ෂිත කරනු ලබන මූලික නීති රීති වලින් සමන්විත "ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය" සකස් කළ අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. "ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය" ක්‍රියාවට නැංවීම උදෙසා,

- ජාතික ජලසම්පත් සභාව (NWRC)
- ජාතික ජල සම්පත් ලේකම් කාර්යාලය (NWRS)
- ජල සම්පත් අභියාචනා මණ්ඩලය (WRAB)

යන නව ව්‍යවස්ථාපිත යාන්ත්‍රණ ත්‍රිත්වය ස්ථාපනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර මේ මඟින් ජල සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් මතු වී තිබූ ගැටලු හා අභියෝග රාශියක් සඳහා විසඳුම් ලැබෙනු ඇත.

## 04.

### බස්නාහිර ප්‍රදේශ මහා නගර ප්‍රධාන සැලැස්ම - 2048 ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම, ආයතනික සම්බන්ධීකරණය සහ මග පෙන්වීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව



බස්නාහිර ප්‍රදේශ මහා නගර ප්‍රධාන සැලැස්ම - 2048 හි සමාලෝචන සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම, ආයතන සම්බන්ධීකරණය කිරීම සහ ඒ සඳහා මග පෙන්වීම පිණිස ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් යුතුව අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කර ඇති අතර මෙම සමාලෝචන ක්‍රියාවලිය නිරන්තරව සිදු කෙරෙමින් පවතී.

## 05.

### විශේෂිත සේවාවන්ට හා තනතුරුවලට අදාළව අනිවාර්ය විශ්‍රාම ගැන්විය යුතු වයස් සීමා යළි සලකා බැලීම පිණිස පත්කළ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව




මෑත කාලීනව රට තුළ මතුව ඇති ආර්ථික හා සමාජීය අභියෝගාත්මක අවකාශය තුළ මෙන්ම විදේශ රැකියා වෙළඳ පොළ තුළවිශේෂිත සේවා සඳහා තිබෙන ඉල්ලුම ප්‍රසාරණය වීම හේතුවෙන් වෛද්‍ය, දන්ත ශල්‍ය වෛද්‍ය මෙන්ම විශේෂවෛද්‍යවරුන් විශාල පිරිසක් ඉතා කෙටිකාලයක් ඇතුළත විදේශවලට සංක්‍රමණය වීම මෙන්ම විදේශ පුහුණු සඳහා පසුගිය වසරවල පැවති කොවිඩ් වසංගත තත්ත්වයන් තුළ ප්‍රමාණවත් වෛද්‍ය

නිලධාරීන් පිරිසක් යොමු කිරීමට නොහැකිවීම නිසා රටට අවශ්‍ය විශේෂඥ වෛද්‍ය නිලධාරි ඇතුළු වෛද්‍ය නිලධාරින් අවශ්‍යතාව සපුරා ගැනීම අභියෝගයක් වී ඇත. මේ පිළිබඳව සොයා බලා විශේෂිත සේවාවන්ට හා තනතුරුවලට අදාළව අනිවාර්ය විශ්‍රාම ගැන්විය යුතු වයස් සීමා යළි සලකා බැලීම පිණිස ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කර ඇත. මෙම කමිටුව මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සභාවන් යටතේ සේවයේ යෙදී සිටින සියලුම ශ්‍රේණිවල වෛද්‍ය, දන්ත ශල්‍ය වෛද්‍ය, රජයේ ලියාපදිංචි වෛද්‍ය සහ විශේෂඥ වෛද්‍ය යන කාණ්ඩවලට අයත් නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 දක්වා (2024.12.31 දින තෙක්) දීර්ඝ කිරීම ඇතුළු නිර්දේශ රාශියක් ලබා දී ඇත.

## 06.

**පළාත් පාලන ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම වෙනුවෙන් සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා වන කමිටුව**




නිල කාලය අවසන්ව ඇති පළාත්පාලන ආයතනවල මහජන නියෝජිතයන් නැවත පත්වන තෙක් එම ආයතනයන් හි පාලන කටයුතු මැනවින් සිදු කිරීම පිලිබඳ අධීක්ෂණය කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් හා ගරු අමාත්‍යවරුන්, ගරු රාජ්‍ය අමාත්‍යවරුන්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ගරු ආණ්ඩුකාරවරුන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපතිවරුන්, ප්‍රධාන ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් යුත් කමිටුවක් පත් කර ඇත.

## 07. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරි කමිටුව



වර්තමාන අභියෝගාත්මක ආර්ථික අවකාශය තුළ රජයේ වියදම් ප්‍රශස්ථව කළමනාකරණය කිරීමේ අරමුණින් රාජ්‍ය සේවයේ සියලු බඳවා ගැනීම් අත්හිටුවීමට ප්‍රතිපත්තිමය තීරණයකට එළැඹිය ද, ඇතැම් ආයතනවල කාර්යයන් බාධාවකින් තොරව පවත්වාගෙන යාමටත්, මහජන සේවා ප්‍රශස්ථ මට්ටමින් හා කාර්යක්ෂමව තව දුරටත් පවත්වාගෙන යාම සඳහාත් අත්‍යාවශ්‍ය අවම කාර්යමණ්ඩලය පමණක් බඳවා ගැනීම පිණිස අනුමැතීන් ලබාදීමේ තාවකාලික යාන්ත්‍රණයක් ලෙස රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතු සය පුද්ගල කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇත. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද එම නිලධාරී කමිටුව වෙත කරන ලද ඉල්ලීම් අනුව කමිටු තීරණ සහිත අතුරු වාර්තා 10ක් හා අවසන් කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.ඒ අනුව, අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වෙතින් ලද ඉල්ලීම් ප්‍රකාරව එක් එක් තනතුරු මට්ටම් සඳහා පහත පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

| # | රැකියා කාණ්ඩය | අත්‍යවශ්‍යමයැයි ප්‍රකාශිතව ඉල්ලා සිටි පුරප්පාඩු සංඛ්‍යාව | කාණ්ඩ හතරේ එකතුව ප්‍රතිශතයක් ලෙස(%) | කමිටු විසින් අනුමැතිය සඳහා නිර්දේශ කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **01** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14285 | 14% | 9442 |
| **02** | තෘතියික මට්ටම | 4203 | 4% | 2933 |
| **03** | ද්විතියික මට්ටම | 29876 | 17% | 11684 |
| **04** | ප්‍රාථමික මට්ටම | 52960 | 65% | 43649 |
| | එකතුව | **101324** | **100%** | **67708** |

## 08.

## ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්‍ෂණික උපදේශක කමිටුව



අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් පත් කරන ලද "ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ තාක්‍ෂණික උපදේශක කමිටුව" මඟින් ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳ වැඩසටහන්වල තාක්ෂණික මට්ටමේ ආයතනික සම්බන්ධීකරණය සිදු කෙරේ.

මෙහිදී රටේආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ අභියෝගයට විසඳුම් සෙවීම රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශ මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානවල සක්‍රීය දායකත්වයෙන් ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ සිදු කෙරෙමින් පවතී.



## 09.

## ජාතික මෙහෙයුම් මැදිරිය ස්ථාපනය කිරීම (Establishment of a National Operation Room - NOR)




2023 වර්ෂය සඳහා වන අයවැය මඟින් යෝජිත පරිදි රට තුළ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව හා වඩාත් ඵලදායිව ක්‍රියාත්මක කරවීම හා එම ව්‍යාපෘතිවල අදාළ ගැටලු නිරාකරණය කිරීම සඳහා, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුත් “ජාතික මෙහෙයුම් මැදිරිය” ස්ථාපනය ඇත. විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් නියමිත කාල සීමාව තුළදී නිම කිරීමට හැකි වන පරිදි කටයුතු මෙහෙයවීම, ඉදිරිපත්වන ගැටලු සම්බන්ධයෙන් උපායමාර්ගික තීරණවලට එළැඹීම හා ඒ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම “ජාතික මෙහෙයුම් මැදිරිය” සතිපතා රැස් වෙමින් නිරන්තරව සිදු කරනු ලබයි.



# 10.

## දේශීය වෙළඳපොළෙහි බිත්තර මිල ස්ථායිකරණය පිණිස බිත්තර ආනයනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව

වත්මන් අභියෝගාත්මක ආර්ථික අවකාශය තුළ ළමා මන්දපෝෂණය දුරලීම හා ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමේ අභියෝගයට විසඳුමක් ලෙස, දේශීය වෙළඳපොළහි බිත්තර මිල ස්ථායිකරණය කිරීම සිදු කළ යුතුව ඇත. ඒ අනුව, දේශීය වෙළඳපොළහි බිත්තර මිල ස්ථායිකරණය අරමුණු කොට දේශීය බිත්තර ගොවීන්ද ආරක්ෂා කරගනිමින් පවත්නා හිඟය අවම කිරීමට අවශ්‍ය බිත්තර ආනයනය කිරීම පිළිබඳ කටයුතු සොයා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් හා එම කමිටුවේ කටයුතු සඳහා සහායවීමට අග්‍රාමාත්‍ය ලේකම්වරයා සභාපතීත්වයෙන් යුතු නිලධාරී කමිටුවක් පත් කර ඇත. මෙම කමිටුව විසින් බිත්තර නිෂ්පාදනය හා ඉල්ලුම පිළිබඳ විශ්ලේෂණය කොට බිත්තර සඳහා දෛනික වෙළඳපළ ඉල්ලුම සපුරාලීම පිණිස ගතයුතු කඩිනම් පියවර සඳහන් කරමින් නිර්දේශ ලබාදී ඇත.



## 2.3.2 සංවර්ධන II අංශය මඟින් සිදුකළ විශේෂ මැදිහත් වීම්

### 01. චීනය සහ ශ්‍රී ලංකාව අතර ව්‍යාපෘති සහ පාරිසරික සම්මුතිය සම්බන්ධයෙන් චීනයේ ෂැන්ඩොං පළාතේ නියෝජිත පිරිස සමඟ සිදුකළ සාකච්ඡාව

ශ්‍රී ලංකා සහ චීන සහයෝගීතාවය යටතේ චීනයේ ෂැන්ඩොං පළාතේ පරිසර විද්‍යා හා පරිසර දෙපාර්තමේන්තුවේ නියෝජිත පිරිස සහ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් අතර සාකච්ඡාවක් 2023 නොවැම්බර් 09 වන දින අරලියගහ මන්දිරයේ දී පැවැත්වීමට කටයුතු යෙදිණි. එහිදී, දෙරට අතර පාරිසරික සහයෝගීතාව වර්ධනය කරගැනීම පිළිබඳ ව අවධානය යොමු වූ අතර, ඵලදායි සංවාදයෙන්

අනතුරුව, චීනයේ ෂැන්ඩොං පළාතේ පරිසර විද්‍යා හා පරිසර දෙපාර්තමේන්තුව විසින් ජෛව විවිධත්වය, පරිසර දූෂණ පාලන තාක්ෂණයන් සහ දේශගුණික විපර්යාස සඳහා ප්‍රතිචාර පිළිබඳ සහයෝගීතාව යන ක්ෂේත්‍ර සඳහා සහයෝගය දැක්වීමට එකඟතාව පල කරන ලදී.



### 02. "විදුලි බස් රථ මෙහෙයවීම සහ හරිත ප්‍රවාහන ආයෝජන සැලස්මක් සංවර්ධනය කිරීම හරහා ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් සංචලනය සඳහා ඉඩ සලසන පරිසරයක් නිර්මාණය කිරීම" පිළිබඳ සාකච්ඡාව

දකුණු කොරියාවේ ප්‍රධාන මධ්‍යස්ථානයේ ස්ථාපිත Global Green Growth Institute – (GGGI) විසින් සුහුරු හා විද්‍යුත් ප්‍රවාහන සේවයක් හඳුන්වාදීම පිළිබඳ පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ඇත. ඒ අනුව විද්‍යුත් බස්රථ සහ සුහුරු ප්‍රවාහන පද්ධති හඳුන්වාදීම මඟින් කොළඹ පොදු ප්‍රවාහන සේවාවන් හරිතකරණය කිරීමේ මෙහෙයුම් පිළිබඳ තාක්ෂනික හා මූල්‍ය ශක්‍යතාව පිළිබඳ අනාවරණය කර ගන්නා ලද අතර, එහි නියමු ව්‍යාපෘතියක් ලෙස කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (KOICA) මඟින් විදුලි බස් රථ 10 ක් හා ආරෝපණ මධ්‍යස්ථාන 12ක් ස්ථාපිත කිරීමේ නියමු

ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට එකඟතාවය පලකරන ලදී. ඒ සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා මැදිහත්වීම අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන II අංශය විසින් සිදු කරනු ලබයි




## 03. CILUSCA සහ BRODER ස්ථාපනය කිරීමේ වැඩසටහන හා "NI HAO ZHONG GUO" සංචාරක වැඩසටහන සංවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීම සහ සංවර්ධන සහයෝගීතාව ඇති කිරීම පිළිබඳ ශ්‍රී ලංකා-චීන (වොන්ක්වින්ග්) වටමේස සාකච්ඡාව 2023 ජූලි 22 වැනි දින අරලියගහ මන්දිරයේදී පවත්වනු ලැබූ අතර, එහිදී එක්සත් ජනපදය සහ චීනය අතර අන්තර් සහයෝගීතාවය ඇති කිරීම පිළිබඳ කමිටුව (CILUSCA) හා " තීරය සහ මාවත ඩිජිටල් ආර්ථික ප්‍රතිසංස්කරණ කවුන්සිලය" (BRODER) ස්ථාපනය කිරීම සඳහා වන සාකච්ඡාවක් ද පවත්වන ලදී. තවද, ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටු දැකීම හා සංවර්ධනය සහයෝගීතාවය වර්ධනය කිරීම උදෙසා තීරය හා මාවත කමිටුව පිහිටුවීම ද "NI HAO ZHONG GUO" විශේෂ සංචාරක වැඩසටහන ආරම්භ කිරීමට ද මෙහිදී යෝජනා කරන ලදී.



## 04 . ක්ෂුද්‍ර, කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ධාරිතාව ඉහල නැංවීම

ශ්‍රී ලංකාව මේ වනවිට මුහුණ දෙමින් සිටින ආර්ථික අභියෝග සඳහා සක්‍රීය දායකත්වයක් ලබා දීම පිණිස ගත හැකි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස නව ව්‍යවසායකයින් බිහිකිරීම හා පවතින ව්‍යවසායකයින් නඟා සිටුවීම හඳුනාගන්නා ලදී. ඒ අනුව, ව්‍යවසායකත්ව ශක්‍යතාවයක් හා විභවයක් පවතින ව්‍යවසායකයින් බැංකු මඟින් සිදු කරන අපක්ෂපාතී තෝරා ගැනීමක් තුළින් හඳුනා ගනු ලබන අතර, එම ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය උපදේශන සේවා ලබාදීමත්, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, යටිතල පහසුකම්, අලෙවි හා තාක්ෂණික පහසුකම් වශයෙන් මූල්‍යමය නොවන පහසුකම් සැලසීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීමත් නව ක්‍රමෝපායන් හඳුන්වා දීමට කටයුතු කරන ලදී. එහි මූලික අදියර වශයෙන් මහජන බැංකුව සහ DFCC බැංකුව යන බැංකු විසින් මේවන විටත් ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැලසීමේ වැඩසටහන් තුළින් මූල්‍ය සහයෝගය ලබා දී ඇති ව්‍යවසායකයින් අතුරින් ධාරිතා වර්ධනය සඳහා විභවයක් ඇති පිරිස තෝරා ගෙන ඔවුන්ට තම ව්‍යාපාර ඉහල මට්ටමකට ගෙන ඒ සඳහා ඇති ගැටළු හා අභියෝග හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය උපදේශන සේවා, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, යටිතල පහසුකම්, අලෙවි පහසුකම් සහ තාක්ෂණික පහසුකම් යනාදී මූල්‍යමය නොවන පහසුකම් සැලසීම සඳහා ඊට අදාළ රාජ්‍ය ආයතන සමඟ එක්ව කටයුතු ආරම්භ කරන ලදී. ඉදිරියේ දී අනෙකුත් බැංකු සමඟ ද මේ ආකාරයට සම්බන්ධවෙමින් තෝරාගත් ව්‍යවසායකයින්ට රාජ්‍ය ආයතන සමඟ එක්ව සහය ලබා දීමට කටයුතු කිරීම අපේක්ෂා කරනු ලබයි.



## 05 . චීන - ශ්‍රී ලංකා සහයෝගීතාවය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙරට දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩසටහන (Chongquing Municipality)

චීනය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාවය වර්ධනය කිරීම හා දිළිඳුකම පිටු දැකීම සම්බන්ධයෙන් චීනය විසින් පසුගිය දශකය තුළ සිදු කරනු ලැබ ඇති අති සාර්ථක අත්දැකීම් හුවමාරු කරගැනීමේ විශේෂ සාකච්ඡාවක් 2023 ජුලි 22 වන දින අරලියගහ මන්දිරයේ දී ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් පවත්වන ලදී. ඒ අනුව, දරිද්‍රතාවය පිටුදැකීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම පිලිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නය සඳහා චීනයේ චොංග්ක්වීන් (Chongquing) නගරසභා බල ප්‍රදේශයේ සහාය දැක්වීමට එකඟතාව ලබාදී ඇති අතර චොංග්ක්වීන් නගර සභා බල ප්‍රදේශය තම ජනතාව දරිද්‍රතාවයෙන් මුදා ගැනීමට සාර්ථකව කටයුතු කළ විශිෂ්ඨ ආයතනයක් ලෙස හඳුනාගෙන ඇත.එමෙන්ම චීන රජය විසින් අනුග්‍රහය දක්වන විශේෂ ව්‍යාපෘති (Chinese Government Flagship Project) ගෝලීය වශයෙන් අනුග්‍රහය දක්වන ව්‍යාපෘති (Global Capital Flagship Projects) සහ ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති (Sri Lanka Focused Projects) ඇතුළුව මෙරට දරිද්‍රතාවය අවම කිරීම අරමුණු කරගත් වැඩසටහන් රැසක් යෝජිත චීන සහ ශ්‍රී ලංකා සහයෝගිතාවය යටතේ ආරම්භ කිරීමට නියමිත වන අතර මෙම ව්‍යාපෘති සඳහා වන සංකල්ප පත්‍රිකාව අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධානත්වයෙන් මේ වනවිටත් සකස් කරමින් පවතී.



## 06. ඩෙංගු මර්දනය හා පාලනය කිරීම පිළිබඳව ප්‍රගතිය විමසා බැලීම

ඩෙංගු රෝගය පාලනය කිරීම සම්බන්ධව ගරු ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කළ දැනුම් දීම මත රජයේ හා පෞද්ගලික ආයතන ඇතුළු සියලු ස්ථානවල ඩෙංගු රෝග ව්‍යාප්තිය පාලනය කිරීමේ කාර්යයන්හි ප්‍රගතිය සොයා බැලීම පිණිස ගරු අග්‍රාමාත්‍යවරයාගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇත. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි සිකුරාදා හා සෙනසුරාදා යන දිනයන් මෙම ඩෙංගු මර්දනය කිරීමේ කටයුතු සඳහා යොදා ගැනීමට උපදෙස් ලබා දී ඇති අතර, මදුරුවන් බෝවිය හැකි ස්ථානයන් පරික්ෂාකොට ඒ සඳහා නව නිර්දේශ රැසක් මෙම කමිටුව මඟින් ලබා දී ඇත.



## 2.3.3 රාජ්‍ය තාන්ත්‍රික කටයුතු

### ❖ ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාව - 2023.01.20

ශ්‍රී ලංකාවේ පුනර්ජනනිය බලශක්ති සංවර්ධනය කර්මාන්ත, වරාය, තොරතුරු තාක්ෂණය යනාදී සංවර්ධන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දෙරට අතර ආයෝජන අවස්ථා පිළිබඳව පුළුල් ලෙස සමාලෝචනයට භාජනය විණි.



### ❖ ගරු අග්‍රාමාත්‍යවරයා හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඉන්දියානු කවුන්සිලයේ සභාපති සමඟ පැවති සාකච්ඡාව - 2023.03.27

මෙහිදී දැක්වෙන ආයෝජන හා සහයෝගීතාවන් ආශ්‍රිතව සාකච්ඡා කරන ලදී.

- සංස්කෘතික විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදාළ සහායන්
- සංස්කෘතික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලාංකික සිසුන්හට ඉන්දීය විදේශ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
- නව දිල්ලි විශ්වවිද්‍යාලයෙහි සිංහල දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම

ඉහත නව ක්ෂේත්‍ර වල සහයෝගිතාවන් මෙන්ම නව ආයෝජන අවස්ථා පිළිබඳව අවශ්‍ය ඉදිරි කටයුතු අදාළව වගකිව යුතු අමාත්‍යාංශය මඟින් සිදු කිරීමටත් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිරන්තර සහායන් ලබාදීම සිදු කරනු ලැබේ.

## ❖ ගරු අග්‍රාමාත්‍යවරයා සහ චීනයේ යුනාන් පළාතේ ගරු ආණ්ඩුකාරවරයා සමඟ පැවැත් වූ සාකච්ඡාව - 2023.05.17



මහජන චිනයේ යුනාන් ප්‍රාන්ත බල ප්‍රදේශයේ තාක්ෂණික හා ආයෝජන අවස්ථා පුළුල් කරමින් සීතාවක නගර බල ප්‍රදේශය කේන්ද්‍රීය ඒකාබද්ධ සංවර්ධනයක් උදෙසා නව සහයෝගීතාවන් ඇති කර ගැනීමට චීනයේ යුනාන් පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් එකඟතාවය පලකර ඇති අතර, ඒ සඳහා, වර්ග කිලෝ මීටර් 144.05 වූ සීතාවක නගර සංවර්ධන සැලැස්මේ සංකල්ප පත්‍රිකාව ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් යුනාන් පළාත් ගරු ආණ්ඩුකාරවර වෙත මේ වන විටත් යොමු කරනු ලැබ ඇත.

## ❖ ගරු අග්‍රාමාත්‍යවරයා හා මාලදිවයින් විදේශ කටයුතු අමාත්‍යවරයා අතර පැවැති සාකච්ඡාව - 2023.06.07

මෙම සාකච්ඡාවේ දී විවිධ ආයෝජන අවස්ථා රාශියක් පිලිබඳව සාකච්ඡා වූ අතර මෙහිදී පහත

සඳහන් කරුණු පිලිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී

- ශ්‍රී ලංකාව තුළ මාලදිවයින් සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීම
- පිරිවැය දැරීමට යටත්ව මාලදිවයින් වෛද්‍යවරුන් හට ශ්‍රී ලංකාව තුළ සිය

පශ්චාත් අධ්‍යයන කටයුතු සිදු කිරීමට අවස්ථාව උදා කිරීම

- කොළඹ දිස්ත්‍රික්කයේ මීපේ ප්‍රදේශයේ පිහිටි දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිතව මාලදිවයින් ගුරුවරු පුහුණු අවස්ථා සඳහා යොමු කිරීම ඉහත කාර්යයන් ආශ්‍රිතව

මේ වන විට අවශ්‍ය මූලික පියවර අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගෙන ඇති අතර ඒ පිළිබඳ නිරන්තර පසුවිපරම් කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ඇත.



### ❖ කැනේඩියානු මහ කොමසාරිස්වරයා සමඟ පැවති සාකච්ඡාව - 2023.05.17

ගරු අග්‍රාමාත්‍යවරයා හා කැනේඩියානු මහ කොමසාරිස්වරයා අතර සාකච්ඡාවක් 2023.05.17 වන දින පවත්වන ලද අතර එහිදී අම්පාර හාඩි උසස් අධ්‍යාපන ආයතනයේ වැඩි දියුණු කිරීම් සඳහා කැනඩා රජයේ ආධාර ලබා දිමට මූලික එකඟතාවයක් ඇතිවිය. මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර අදාළ සම්බන්ධීකරණ සහායන් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කෙරෙනු ඇත.



## ❖ ගරු අග්‍රාමාත්‍යවරයා හා රුමේනියානු රාජ්‍ය ලේකම්වරයා අතර පැවැති සාකච්ඡාව - 2023.06.25

මෙම සාකච්ඡාවේ දී පහත සඳහන් ආයෝජන අවස්ථා පිළිබඳ අවධානය යොමු කරන ලදී.

i. ශ්‍රී ලංකා සිසුන් සඳහා රුමේනියානු රජය මඟින් ශිෂ්‍යත්ව පිරිනැමීමට (උපාධි, පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි සඳහා)

ii. රජයේ හා පෞද්ගලික අංශයේ නිලධාරින්හට ධාරිතා සංවර්ධන වැඩ සටහන් රුමේනියානු රජයේ මැදිහත් වීම මඟින් ලබා දීම

iii. දෙරට තුළ පිහිටි විශ්ව විද්‍යාල අතර දැනුම් හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

iv. අපජල කළමනාකරණය, දුම්රිය එන්ජින් පුනරුත්ථාපනය හා නිෂ්පාදන කටයුතු, ආහාර සැකසුම් හා සංචාරක යන අංශයන්හි කටයුතු සඳහා රුමේනියානු ආයෝජකයින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව පදනම යටතේ ආයෝජන සඳහා දිරි ගැන්වීම

v. ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා රුමේනියානු වෙළඳපොළ තුළ අවස්ථාවන් ලබා දීම

vi. වරාය සංවර්ධන කටයුතු සඳහා දෙරට අතර ඒකාබද්ධතාවයක් ඇති කරලීම

vii. ශ්‍රී ලාංකිකයන් හට රුමේනියානු රජයේ රැකියා අවස්ථා ලබාදීම පුළුල් කිරීම

මෙම ආයෝජන අවස්ථාවන්හි ප්‍රතිලාභ මෙරටට ලබා ගැනීම උදෙසා රුමේනියානු තානාපති කාර්යාලය සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර එහි පූර්ව කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇත.



❖ ගරු අග්‍රාමාත්‍යවරයා සහ නවසීලන්ත මහකොමසාරිස්වරයා අතර පැවති සාකච්ඡාව - **2023.06.08**



මෙම සාකච්ඡාවේ දී පහත වැඩසටහන් පිලිබඳ එකඟතාවයකට පැමිණෙන ලදී.

i. මහරගම පිහිටි මුඛ සෞඛ්‍ය ආයතනයේ වැඩි දියුණු කිරීම සම්බන්ධව සහය දැක්වීමට නවසීලන්ත මහකොමසාරිස්වරයා මූලික එකඟතාවය පල කිරීම

ii. රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නවසීලන්ත රජයේ විශේෂඥ දැනුම ලබා දීමට එකඟ වීම

iii. ආදී වාසි ඉඩම් ගැටලු විසඳීම සම්බන්ධයෙන් නවසීලන්ත රජයේ අත්දැකීම් හුවමාරු කර ගැනීම

## 2.3.4 පාර්ලිමේන්තු කටයුතු ඒකකය මඟින් ඉටු කරන ලද කාර්යයන්

**අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල සටහන් සම්බන්ධ කටයුතු කිරීම**

ගරු අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල සටහන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම හා අදාළ සම්බන්ධීකරණය සංවර්ධන අංශයේ II පාර්ලිමේන්තු කටයුතු අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව, 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා මාස 12ක කාලරාමුව තුළ විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 27 ක්, අමාත්‍ය මණ්ඩල සටහන් 13ක් සහ නිරීක්ෂණ 30 ක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබ ඇත.

**අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ සටහන් පිළියෙල කිරීම**

අමාත්‍ය මණ්ඩල රැස්වීම් පැවැත්වීමට පෙර අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සතිපතා ගරු අග්‍රාමාත්‍යවරයාගේ අවධානය සඳහා එවනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවල අන්තර්ගතය ඇතුළත් සාරාංශ වාර්තා ගරු අග්‍රාමාත්‍යවරයා වෙත හා අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත යොමු කෙරෙන අතර පසුගිය මාස 12 ක කාලය තුළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ වාර්තා 47ක් සකස් කරනු ලැබ ඇත.

**අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ආශ්‍රිත දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම**

සියලුම අමාත්‍යාංශ විසින් තම විෂය පථයට අදාළ කාර්යයන් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන්, ඊට අදාළ නිරීක්ෂණ හා තීරණ පරිලෝකනය කර (Scan) දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කිරීම හා මාණ්ඩලික නිලධාරිගේ අනුමැතිය සහිතව කාර්යාලයීය අවශ්‍යතා සඳහා යාවත්කාලීන කරන ලද තොරතුරු අදාළ නිලධාරීන්ට ලබා දීම අඛණ්ඩව සිදු කරනු ලැබ ඇත.

**යෝජනා සම්මත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

ගරු ජනාධිපතිවරයා විසින් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන නීතිමය කාර්යයන් අවසන් කර ඇති පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මෙන්ම ගරු අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු යෝජනා සම්බන්ධයෙන්
යෝජනා සම්මත සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සිදු කරනු ලබන අතර අදාළ කාලසීමාව තුළ එලෙස යෝජනා සම්මත 17ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

## පාර්ලිමේන්තු ප්‍රශ්න පිළිතුරු සැපයීම

ගරු ජනාධිපතිවරයාගේ හා ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථයට අදාළව විපක්ෂ හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ප්‍රස්තුත කාලසීමාව ඇතුළත ගරු අග්‍රාමාත්‍යවරයා වෙතින් විමසන ලද වාචික ප්‍රශ්න සියල්ල සඳහා අදාළ පිළිතුරු සැපයීමට කටයුතු කර ඇත.

- ගරු ජනාධිපතිවරයාගේ විෂය පථය යටතට අයත් අමාත්‍යාංශ හා ජනාධිපති කාර්යාලයට අයත් වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න - 14

- ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට අයත් අමාත්‍යාංශ හා අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න - 36



## පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම

ගරු ජනාධිපතිවරයාගේ හා ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විෂය කරුණු සම්බන්ධයෙන් වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා හා ගිණුම් ප්‍රකාශ යනාදි වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් නිරන්තරව සිදු කරනු ලබන අතර, මේ වන විට පහත කරුණු යටතේ වාර්තා 23ක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබ ඇති අතර එම වාර්තා පහත පරිදි වේ.



## පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ කාර්ය සාධන වාර්තා

- ජාතික පොලිස් කොමිෂන් සභාව -2022
- මැතිවරණ කොමිෂන් සභාව -2022
- මුදල් කොමිෂන් සභාව -2022
- ජනාධිපති කාර්යාලය -2022
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව -2022
- උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් -2022
- පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය -2022
- සීමා නිර්ණය කොමිෂන් සභාව -2022

## පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත්කළ වාර්තා

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව -2020
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව -2021

## ස්ථාවර නියෝග 119(4)

- අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- මුදල් කොමිෂන් සභාව
- ඔම්බුඩ්ස්මන් කාර්යාලය
- මැතිවරණ කොමිෂන් සභාව
- උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
- මානව හිමිකම් කොමිෂන් සභාව
- පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය
- ජාතික පොලිස් කොමිෂන් සභාව
- අධිකරණ සේවා කොමිෂන් සභාව
- ජාතික විගණන කාර්යාලය

## වෙනත්

අග්‍රාමාත්‍ය කාර්යාලය - ඉදිරි දශකය සඳහා ජාතික බලශක්ති විභවයන්,ක්‍රමෝපායයන් හා මාර්ග සිතියම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටු වාර්තාව

## 2.4 සංවර්ධන අංශය III

### 2.4.1 සංවර්ධන III අංශය මඟින් ඉටුකළ විශේෂ කමිටු සහ අනු කමිටු සම්බන්ධ කටයුතු




රජයේ ආදායම් උත්පාදනය කිරීමට වැදගත් වන ප්‍රධාන ආයතන 13ක් මූලික වටයේදී තෝරාගෙන තොරතුරු තාක්ෂණ පද්ධතීන් ඒකාබද්ධ කිරීම මඟින් රජයේ ආදායම එකතු කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කිරීම අධීක්ෂණය කිරීමට පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතුව කමිටුවක් පත් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, කොළඹ මහා නගර සභාව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යන රාජ්‍ය ආයතන 13ට අදාළව මූලික වාර්තාවක් සකස් කර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත භාර දෙන ලදී. මෙම කමිටුව විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙත භාරදෙන ලද මූලික වාර්තාවට අනුව 2023.10.13 දිනට අදාළ ප්‍රගතිය ඇතුලත් වාර්තාව 2023.10.18 වන දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේලේකම් වෙත භාරදෙන ලදී. මීට අදාළව පාර්ශවකරුවන් විසින් සහ පාර්ශවකරුවන්මඟින්ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව නිරතුරුව ප්‍රගතිය සමාලෝචනය සහ අදාළ අධීක්ෂණ කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ මූලික තාක්ෂණික කමිටුවේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට අදාලව

රැස්වීමක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2023.10.19 වන දින පවත්වන ලදී. අදාළ වාර්තාව සංවර්ධන අංශය III මැදිහත්වීම මඟින් සිදු කරනු ලැබේ.

## 02.

**මාර්ගගත ක්‍රමය ඔස්සේ විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා හැඳුනුම්පත් කළමනාකරණ ක්‍රියාවලියට ජෛවමිතික දත්තයන් ඇතුලත් කිරීම සහ E-NIC ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව දීර්ඝ කිරීම**




මාර්ගගත ක්‍රමය ඔස්සේ විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම දිවයින පුරා ව්‍යාප්ත කිරීම, හැඳුනුම්පත් කළමනාකරණ ක්‍රියාවලියට ජෛවමිතික දත්තයන් ඇතුළත් කිරීම සහ E-NIC ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව දීර්ඝ කිරීම යන මැයෙන් යුතු අමාත්‍ය මණ්ඩල සංදේශය ආශ්‍රිතව තීරණයකට එළඹීම පිණිස, ශ්‍රී ලංකාව සඳහා ජාතික ඩිජිටල් ආර්ථික උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පත් කරනු ලැබ ඇති ඉහළ මට්ටමේ නිලධාරී කමිටුව හරහා වාර්තාවක් ලබා දෙන මෙන් දැනුම් දෙන ලදී. අදාළ කමිටුව 2023.12.11 දින අග්‍රාමාත්‍ය කාර්යාලයේදී රැස්වී එළැඹී එකඟතාවලට අනුව නිර්දේශ 05 කින් යුක්තව සකසන ලද වාර්තාව 2023.12.29 දින ගරු. මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

## 03.

## තිරසර සංවර්ධන අරමුණු සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව



තිරසර සංවර්ධන (SDG) ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ මෙහෙයුම් කමිටුව ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් මාස 03කට වරක් පවත්වනු ලබයි. තිරසර සංවර්ධන සභාවේ දායකත්වයෙන් ගරු ජනාධිපතිවරයා හා ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ඇතිවන බාධාවන් හඳුනාගැනීම හා එම බාධාවන් අභිබවමින් නියමිත ඉලක්ක වෙත ළඟාවීම හා තිරසර සංවර්ධන ගමන් මාර්ගය පිළිබඳ සංසදය (Forum on Sri Lanka's Sustainable Development Trajectories and Pathways) 2023.08.29 දින අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මෙරට නියෝජිතවරිය විසින් තිරසර සංවර්ධන අභිමතාර්ථ සම්බන්ධයෙන් වන "Sustainable Development Goals Insight Report" (AI Generated) මෙහිදී ඉදිරිපත් කරන ලද අතර, අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් නිලධාරී මට්ටමේ කමිටුව හරහා මාස 03 කට වරක් මෙම ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබේ. ඒ අනුව, තිරසර සංවර්ධන අරමුණු 02 සහ 05 ට අදාළ ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය, තිරසර කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම සහ "ජාතික තිරසර ප්‍රගති පුවරුව" යාවත්කාලීන කරගෙන යාම සම්බන්ධයෙන් හඳුනාගත් ගැටලු සාකච්ඡා කිරීමේ අරමුණ ඇතිව අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සමඟ 2023.11.17 දින තිරසර සංවර්ධන අරමුණු සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුවේ නිලධාරී මට්ටමේ කමිටු රැස්වීම අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. එහිදී, තිරසර අරමුණු 02 හා 05 යටතේ හඳුනාගත් ගැටලු සම්බන්ධයෙන් අදාළ ආයතන වෙත වගකීම් පවරන ලද අතර ඒ අනුව, සංවර්ධන අංශය III මැදිහත් වී ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලැබේ.

# 04.

## ඩිජිටල් ආර්ථික උපාය මාර්ග (Digital Economic Strategy)




වේගවත් ආර්ථික සංවර්ධනයක් සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ග අත්‍යාවශ්‍ය සාධකයක් බව හඳුනාගෙන ඇත. විශාල ආර්ථික ප්‍රතිලාභ අත්කර ගනු පිණිස ඩිජිටල් නිෂ්පාදන හා සේවා උත්පාදනය, ප්‍රශස්ත කිරීම, ගනුදෙනු පිරිවැය අඩු කිරීම හා නවීන ඩිජිටල් තාක්ෂණය දිරිමත් කිරීම මගින් මහජනතාව වෙත වඩාත් කෙටි කලක් ඇතුලත අතිශය පාරදෘශ්‍ය සේවා සැපයීම හා ගෝලීය වටිනාකම් දාමයන්ට ඉදිරිපත්වීම සිදු කළ යුතුව ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජාතික ඩිජිටල් උපාය මාර්ගික සැලැස්ම - 2030 අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතු ඉහළ විද්වත් කමිටුව විසින් හා ලෝක බැංකුවේ තාක්ෂණික දායකත්වය ද ඇතිව සකස් කෙරේ. මෙහිදී ප්‍රධාන තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් (Thematic Working Groups) 06ක් ඔස්සේ මෙම ආර්ථික උපාය මාර්ගික ප්‍රවේශය සකස් කරනු ලැබ ඇත. එම යෝජිත උපාය මාර්ග, ඊට අදාළ නිශ්චිත කාල රාමු සහ එහි මාර්ග සිතියම සහිතව සකස් කර එම වාර්තාව 2023.11.20 දින ජනාධිපති ලේකම්වරයා වෙත යොමු කර ඇති අතර, ඩිජිටල් ආර්ථික උපාය මාර්ග ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා ඩිජිටල් සංවර්තන සංස්ථාව ස්ථාපනය කිරීමට එමගින් යෝජනා කර ඇත.

## 05.

## වන විනාශය හා නීති විරෝධී වැලිගොඩ දැමීම් වැළැක්වීමේ කමිටුව



වනාන්තර ඉවත් කිරීම හා විනාශ කිරීම විවිධ පාරිසරික අසමතුලිතතාවයන් සඳහා හේතු වන අතර එය දීර්ඝකාලීනව සිදුවුවහොත් දේශගුණික විපර්යාස ඇතිවීම, ගෝලීය උණුසුම ඉහළ යාම හා ජෛව විවධත්වය හීන වීම වැනි විවිධාකාර අහිතකර බලපෑම් එල්ල වීමටත් එමඟින් මිනිසා ඇතුළු ජීවින්ගේ පැවැත්ම අර්බුදකාරී වීමටත් හැකි බව පුරෝකථනය කර ඇත. එම නිසා අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති, දැව ජාවාරම් හා නීති විරෝධී වැලිගොඩ දැමීම වැනි පාරසරික විනාශකාරී ක්‍රියාවන් අවම කිරීම තුළින් පරසරය සමඟ සහයෝගීව සිදු කරනු ලබන තිරසාර සංවර්ධනය සඳහා ප්‍රවිශ්‍ය වීම කාලීන අවශ්‍යතාවයක්ව පවතී. ඒ අනුව වනාන්තර විනාශය, නීති විරෝධී වැලිගොඩ දැමීම් වැළැක්වීම හා පරිසර සංරක්ෂණය සිදු කිරීම සඳහා විස්තරාත්මක අධ්‍යයනයක් සිදුකර සුදුසු ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමට සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අදාළ විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ත්‍රිවිධ හමුදාපතිවරුන් හා පොලිස්පතිතුමන් ඇතුළු සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කරනු ලැබ ඇත. මෙම කමිටුව 2023.10.18 දින අග්‍රාමාත්‍ය කාර්යාලයේ දී ප්‍රථම වරට රැස්වූ අතර, මේ පිළිබඳ අදාළ කමිටු සාමාජිකයන්ගේ නිර්දේශ, යෝජනා සහ ක්‍රියාකාරී සැලැස්මක් ඇතුලත් කෙටුම්පත් වාර්තාවක් සකස් කරන ලදී.

## 06.

## රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන




මූල්‍ය කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් අදාළ ක්ෂේත්‍රවලට අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු නව සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය පිණිස දියත්කොට ඇති ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිත ව්‍යවසායන් අශ්‍රිතව සිදු කෙරෙන ප්‍රසම්පාදන ක්‍රියාවලින්ට අනුගතවෙමින් වඩාත් පාරදෘශ්‍ය ක්‍රමවේද ඔස්සේ ආයෝජකයන් තෝරා ගැනීමට සහතිකවනු පිණිස ස්ථාපිත කොට ඇති රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ (SOERU) කාර්යයන්ට සහය වනු පිණිස යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතුව සාකච්ඡා හා සම්මුති කමිටුවක් පත් කරනු ලැබ ඇත. රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලියේ කටයුතු සම්බන්ධයෙන් මෙම කමිටුව විසින් අවශ්‍ය දායකත්වයන් සිදු කරමින් පවතී.

## 2.4.2 සංවර්ධන III අංශය මඟින් ඉටුකළ විශේෂ මැදිහත් වීම්

### 01. ශ්‍රී ලංකාවේ උපත් ලියාපදිංචිය මාර්ගගතව සිදු කිරීම

ඉ-ජනගහන ව්‍යාපෘතිය මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි උප්පැන්න සහතික නිකුත් කිරීමේ පළමු අදියර වශයෙන් ජාතික උප්පැන්න සහතිකය ඩිජිටල් සහතිකයක් ලෙස මෘදුකාංග පද්ධතිය හරහා සිදු කිරීමටත්, දෙවන අදියර ලෙස මාර්ගගත ක්‍රමයට උපත් ලියාපදිංචිය සිදුකිරීමටත් අදාලව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා ව්‍යාපෘතියේ පද්ධති සංවර්ධනයන්ද සමඟ අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූලිකත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 තුළ ඉ-ජනගහන වැඩසටහන ව්‍යාප්ත කරමින් ඒ හරහා ඩිජිටල් උප්පැන්න සහතික නිකුත් කිරීම නිල වශයෙන් 2023.12.05 දින රාජ්‍ය අමාත්‍යවරයාගේ, දිස්ත්‍රික් දේශපාලන නායකත්වයේ සහ අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදී.




### 02. ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීම පිණිස ප්‍රතිපත්තිමය එකඟතාවය

ශ්‍රී ලංකාව 2048 වනවිට තිරසර සංවර්ධිත රටක් බවට පරිවර්තනය කිරීම උදෙසා සිදු කරන ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් පිළිබඳ මහජනතාව සමඟ මනා සන්නිවේදනයක් හා එකඟතාවයක් ඇති කර ගැනීම පිණිසත්, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන විවිධ සංවර්ධන ප්‍රවේශයන් හා ක්‍රමෝපායයන් නිවැරදිව ක්‍රියාත්මක කිරීමට හා එම කටයුතු නියාමනය කිරීම සඳහා පොදු ව්‍යවස්ථාපිත ස්ථාවර ප්‍රතිපත්ති මෙහෙයුම් යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ජාතික සභාව විසින්

හඳුනාගනු ලැබ ජනාධිපති ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතුව පත්කළ 35 දෙනෙකුගෙන් යුක්ත ක්‍රියාකාරී කමිටුව මඟින් යෝජිත ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වූ වාර්තාව මේ වනවිට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.



## 03. දකුණු ඉන්දියාවේ අවතැන් වී සිටින ශ්‍රී ලාංකිකයන් වෙත සියලුම රටවල් සඳහා වූ විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීම පහසු කෙරෙන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

දකුණු ඉන්දියාවේ අවතැන් වී සිටින ශ්‍රී ලාංකිකයින් හට සියලුම රටවල් සඳහා වලංගු විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතුව පත් කරන ලද කමිටුව රැස්වීම් වාර 04ක් පවත්වන ලද අතර පසුබිම්ගත කරුණු හා දත්ත මූලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව දකුණු ඉන්දියාවේ අවතැන් වූ ශ්‍රී ලාංකිකයින් වෙත සියලුම රටවල් සඳහා වලංගු විදෙස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා වූ නිර්දේශ
ඇතුළත් කමිටු වාර්තාව 2023.12.21 දිනැතිව ජනාධිපති ලේකම්වරයා වෙත යොමු කරන ලදි. මෙම කමිටු නිර්දේශ අනුව, චෙන්නායි හි නියෝජ්‍ය ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත ලද ගුවන් බලපත් අයදුම්පත්‍ර සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ මැදිහත්වීම මත ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් විදෙස් ගමන් බලපත්‍ර 198ක ප්‍රමාණයක් නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර, 2024 වර්ෂයේ ජනවාරි මස ගමන් බලපත්‍ර නිලවශයෙන් ප්‍රදානය කිරීමට ද කටයුතු යොදා ඇත.



## 04. ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ ගිවිසුම්ගත සේවා හා ගාස්තු සංශෝධනය කිරීම

මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සේවාව විනිවිදභාවයකින් යුතුව හා කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් යෝජිත ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ ගිවිසුම්ගත සේවා හා ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධව උද්ගත වී තිබූ ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් ඒ පිළිබඳව අධ්‍යයනය කර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. එලදායි රැස්වීම් වාර ගණනාවකින් අනතුරුව අදාළ වාර්තාව 2023.05.17 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාව සහ අනෙකුත් කරුණු සලකා බලා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ 2023.06.13 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.



## 05. වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සමාලෝචනය කිරීම

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය පිහිටුවීමට කටයුතු යෙදවීමෙන් පසු වාණිජ දෙපාර්තමේන්තුව වෙත පැවරෙන කාර්යයන් නිශ්චිතව හඳුනාගෙන එම දෙපාර්තමේන්තුවේ දැනට පවතින පරිපාලන ව්‍යුහය ඒ අයුරින්ම පවත්වාගෙන යා යුතු ද යන්න පිළිබඳව කරුණු අධ්‍යයනය කර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලද අතර, ඒ පිළිබඳ නිර්දේශ හා යෝජනා සහිත වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබ ඇත.



# 06. බහුමානික දරිද්‍රතා දර්ශකය (Multidimensional Poverty Index-MPI) ප්‍රතිපත්ති මෙවලමක් ලෙස භාවිතා කිරීම

බහුමානික දරිද්‍රතා දර්ශකය (MPI) ප්‍රතිපත්ති මෙවලමක් ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ OPHI (Oxford Poverty and Human Development Initiative) විධායක අධ්‍යාපන ආයතනයේ සංවිධානත්වයෙන් 2023.11.13-17 දක්වා, මාර්ගගත ක්‍රමවේදය හරහා පැවැත් වූ පුහුණු වැඩසටහන සඳහා සහභාගීවීමට අග්‍රාමාත්‍ය ලේකම්වරයා හා අතිරේක ලේකම්වරුන් දෙදෙනෙකු සඳහා මාර්ගගතව ඉගෙනුම් ශිෂ්‍යත්වයන් පිරිනැමුණු අතර,

එහිදී ලබාගත් දැනුම හා හුවමාරු වූ අත්දැකීම් හරහා බහුමානික දරිද්‍රතා දර්ශකය (MPI) ප්‍රතිපත්ති මෙවලමක් ලෙස ජාතික වශයෙන් භාවිතා කිරීම සඳහා අවශ්‍යතාවය පිළිබඳව අග්‍රාමාත්‍ය කාර්යාලයේ මැදිහත් වීම මත රාජ්‍ය අංශයේ ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමට වැඩසටහන් මාලාවක් වසර තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ ඇති අතර ප්‍රථම වරට, 2024 විමධ්‍යගත අයවැය හා කඳුකර දශකය ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් වලදී භාවිතයට ගැනීම ආරම්භ කර ඇ



## 07. ආසියානු සංවර්ධන බැංකුවේ ණය මූල්‍යනය හරහා නිපුණතා අංශය වැඩි දියුණු කිරීම

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ණය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරෙන නිපුණතා අංශය වැඩි දියුණු කිරීමේ දෙවන අදියරේ වැඩසටහන අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ආසියානු සංවර්ධන බැංකු නියෝජිත කණ්ඩායම හා අදාළ පාර්ශවකරුවන් සමඟ 2023.12.04 දින අරලියගහ මන්දිරයේ දී සාකච්ඡා කරන ලදී. මෙම වැඩසටහනේ සැලසුම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව සමඟ සමපාත වීම හා ඒ සඳහා, ක්‍රමානුකූල අධීක්ෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම පිළිබඳ මෙහිදී විශේෂයෙන් අවධානය යොමු කරන ලදී.



## 08. සත්වන දකුණු හා නිරිතදිග ආසියා සමුළුව: තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම

එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක සහ නේපාල වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ සහයෝගීතාවයෙන් නේපාල රජයේ ජාතික සැලසුම් කොමිෂන් සභාව ඒකාබද්ධව මෙම සමුළුව 2023 ඔක්තෝබර් 09 සිට 12 දක්වා නේපාලයේ දී පවත්වන ලද අතර, ප්‍රධාන වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක අංක 1,2,13,16 හා 17 කරා ලඟාවීමේ දී දකුණු හා නිරිතදිග ආසියා කලාපය ලබාගත් ප්‍රගතිය කෙරෙහි අවධානය යොමු කෙරිණි. මෙම සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ හා තිරසර සංවර්ධන සභාවේ නිලධාරීන් සහභාගී වූ අතර, ස්වේච්ඡා

ජාතික සමාලෝචනය Voluntary National Review Clinic (VNR) ක්‍රියාත්මක
කිරීමේ දී ශ්‍රී ලංකාව ලත් අත්දැකීම්, මෙරට තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය, ජාතික මෙහෙයුම් කමිටුවේ (National Level Steering Committee) කාර්යභාරය පිළිබඳව මෙන්ම තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමේ දී ශ්‍රී ලංකාව මුහුණදුන් ගැටලු හා ඉදිරි මඟ සම්බන්ධයෙන් විස්තරාත්මක පැහැදිලිකිරීමක් මෙරට නියෝජිතයින් විසින් එහිදී සිදුකරන ලදි.



## 09. “සුහුරුලිය 2.0” (2024-2026)

ආසියානු පැසිපික් කලාපයේ කාන්තාවන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා සහ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කරමින් ඔවුන්ගේ ව්‍යවසායන්හි ඵලදායිතාව සහ තිරසරභාවය ඉහළ නැංවීමෙන් කාන්තාවන් සවිබල ගැන්වීම අරමුණු කර ගත් "Women in ICT Frontier Initiative (WIFI)" වැඩසටහන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා තොරතුරු තාක්ෂණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආසියා සහ පැසිෆික් පුහුණු මධ්‍යස්ථානය (UN Asia & Pacific Training Centre for Information & Communication Technology for Development - UNAPCICT) සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබන අතර, එහි දෙවන අදියර වශයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ තාක්‍ෂණික සවිබල ගැන්වීමේ අරමුණ පෙරදැරිව “සුහුරුලිය 2.0” ව්‍යාපෘතිය (2024-2026), 2023.11.25 දින ආරම්භ කරන ලදී. එහි ඉදිරි සැලසුම් පිළිබඳ මූලික වටයේ

සාකච්ඡාවක් 2023.12.28 දින අග්‍රාමාත්‍යලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, එහිදී පුළුල් සංවර්ධන සැලස්මක් යටතේ තේමාත්මක ක්‍රියාකාරී කණ්ඩායම් (Thematic Working Groups) 6 ක් පත් කිරීම හා සියලු විෂය පථයන් ඒකාබද්ධ කර මෙම වැඩසටහන ඉදිරියට දියත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට තීරණය විය

## 10. ජාත්‍යන්තරව පිළිගත් විශ්ව විද්‍යාලයන් විසින් පිරිනමනු ලබන වෛද්‍ය උපාධි පාඨමාලා ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම සඳහා පදනම් කරගත යුතු නව ප්‍රමිතීන් හා නිර්ණායක ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම හා අදාළව වෛද්‍ය ආඥා පනත සංශෝධනය කිරීම

ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලයන් විසින් පිරිනමනු ලබන වෛද්‍ය උපාධි පාඨමාලා ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම සඳහා පදනම් කරගත යුතු ප්‍රමිතීන් හා නිර්ණායක ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම සහ වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වෛද්‍ය ආඥා පනතේ විධිවිධාන සංශෝධනය කිරීම පිණිස යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් පිහිටුවනු ලැබ ඇත. එම කමිටුව විසින් ජනාධිපති ලේකම්වරයා වෙත භාර දුන් වාර්තාවට අනු ඉදිරිපත් කළ නිර්දේශ සඳහා 2023.11.27 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, වෛද්‍ය ආඥාපනතට යෝජිත සංශෝධන ඇතුලත් කිරීම සඳහා, අදාළ කෙටුම්පත, නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර ඇති අතර, විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් .

ද, නිර්දේශ සහිත වාර්තාවක් 2023.11.09 දින අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත යොමු කරනු ලැබ ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඒ පිළිබඳ ඉදිරි කටයුතු මෙහෙයවීම හා පසුවිපරම් කිරීම අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන අංශය III මැදිහත්වීම මඟින් සිදු කෙරේ



## 11. බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහයෝගීතාවයෙන් ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම

මෙරට පාසැල් හා වෘත්තීය පුහුණු අංශයන් හි සිසුන් සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ශ්‍රී ලංකා ශාඛාව සමඟ එක්ව ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වැඩිදියුණු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා මූලික සාකච්ඡා කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලයේ මැදිහත් වීමෙන් සිදු කෙරෙමින් පවති.



## 12. සතිමත්භාවය සම්බන්ධයෙන් ජාතික වෙසක් සතිය තුළ සිදු කළ ජාතික වැඩසටහන

2023 වර්ෂයේ වෙසක් පොහොයට සමගාමීව බෞද්ධ සතිපට්ඨාන භාවනාව පදනම් කර ගනිමින්, ගොඩ නැගී ඇති "සතිමත්භාවය" (Mindfullness) පිළිබඳ සංකල්පය මෙරට පාසල් සිසුන්ට සහ උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ට හඳුන්වා දීම අපේක්ෂා කරමින් සියලු පාසල්, විශ්වවිද්‍යාල, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන, තාක්ෂණ විද්‍යාල සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා සති භාවනා වැඩසටහන් සංවිධානය කරන ලදී. මෙහි ආරම්භක වැඩසටහන පාසල් සිසුන් 200 ක සහභාගිත්වයෙන් ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් කොළඹ නිදහස් මන්දිරයේදී පවත්වන ලද අතර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නව අධ්‍යාපනය ප්‍රතිසංස්කරණ යටතේ සතිමත්භාව සංකල්පය විෂයමාලාවට ඇතුලත් කිරීමට පියවර ගනිමින් සිටි.



## 2.4.3 රාජ්‍ය තාන්ත්‍රික කටයුතු

❖ **එක්සත් ජාතීන්ගේ 18වන වෙසක් සැමරුම් උත්සවය හා තායිලන්ත නිල සංචාරය**

එක්සත් ජාතීන්ගේ 18 වන වෙසක් සැමරුම් උත්සවය තායිලන්තයේ අයුත්යා නුවර දී 2023 ජුනි මස 01 සහ 02 යන දින පැවැත්වීමට කටයුතු යෙදුණු අතර වෙසක් දිනය වෙනුවෙන් වූ ජාත්‍යන්තර කවුන්සිලයේ, උත්තරීතර සංඝ සභාවේ හා තායිලන්ත රජයේ ගෞරවනීය ආරාධනයෙන් අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා එම අවස්ථාව සඳහා සහභාගී විය. මෙහිදී " ගෝලීය අර්බුද වලට මුහුණ දීම සඳහා බෞද්ධ දර්ශනය". (Wisdom Coping with Global Crisis) යන මැයෙන් යුතුව ප්‍රධාන දේශණය ද ගරු අග්‍රාමාත්‍යවරයා විසින් පවත්වන ලදි. මෙම නිල සංචාරය තුළදී පහත කරුණු පිලිබඳ සාකච්ඡා කිරීමටත් දෙරට අතර වෙළඳ හා ආයෝජන අවස්ථා පුළුල් කර ගැනීමටත් අවකාශ සලසා ගන්නා ලදී.



• දෙරට අතර නිදහස් වෙළඳාම ඉලක්ක කරගත් බහු ආංශික තාක්ෂණය හා ආර්ථික සහයෝගීතාවය වර්ධනය කිරීම

•දෙරට අතර ආයෝජන අවස්ථා පුළුල් කිරීම

• මෙරට මැණික් හා ස්වර්ණාභරණ අලෙවිය සඳහා ජාත්‍යන්තර වෙළඳපල පුළුල් කිරීම

• යෝජිත තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම කඩිනම් කිරීම

• ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීම

• වරාය නගර ව්‍යාපෘතිය සඳහා තායි සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය

• අන්තර් පුද්ගල සම්බන්ධතාවය හා විහාරස්ථාන අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පුළුල් කිරීම

• තායිලන්ත ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (TICA) සමඟ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

• 2023 වර්ෂයේ නොවැම්බර් මස BIMSTEC සමුළුව පැවැත්වීමට අදාළව අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වය

## ❖ හත්වන දකුණු ආසියා සහ චීන අපනයන වෙළඳ ප්‍රදර්ශනය හා චීන නිල සංචාරය

දකුණු ආසියා සහ චීන අපනයන වෙළඳ ප්‍රදර්ශනය මෙවර 07වන වරටත් චීනයේ යුනාන් ප්‍රාන්තයේ, කුන්මින් නගරය කේන්ද්‍රීයව 2023 අගෝස්තු 16 දින පැවති අතර, චීන රජයේ නිල ආරාධනයෙන් එහි ප්‍රධාන ආරාධිතයා ලෙස අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සහභාගී වී එහි මුඛ්‍ය දේශණය (KeyNote Speech) ද පවත්වන ලදී. ශ්‍රී ලංකාවට ස්වාධීන, එහෙත් ස්ථායි තිරසර සංවර්ධනයක් ලබා කිරීම සඳහා ඇති හැකියාවන් වැඩි දියුණු කිරීම පිණිස අත්‍යවශ්‍ය වන කාර්මික සංවර්ධන ක්‍රියාවලීන් වේගවත් කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීකරණය කිරීමටත් චීන ජනරජයේ සහයෝගය ලබා ගැනීම මෙම සංචාරය තුළින් තවදුරටත් තහවුරු කර ගැනීමට හැකිවිණි. එමඟින් පහත සඳහන් විරහිත ක්ෂේත්‍ර සඳහා චීන මධ්‍යම රජයේ මෙන්ම යුනාන් ප්‍රාන්ත රජයේ සහයෝගය ඉදිරියේදී ලබා ගැනීමට හැකිවනු ඇත.

• රජය විසින් නොවැම්බර් මස අවසන් කිරීමට අපේක්ෂිත ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා චීන රජයේ පූර්ණ සහය සහතික කර ගැනීම

• මෙරට ආහාර සුරක්ෂිතතාව හා දරිද්‍රතාව පිටුදැකීම සඳහා දියත් කෙරෙන තෝරාගත් වැඩසටහන්වලට චීන රජයේ දුප්පත්කම තුරන් කිරීම සඳහා යොදාගත් උපායමාර්ග අනුසාරයෙන් කෘෂිකර්ම, ආහාර හා පශු සම්පත් ක්ෂේත්‍ර ආශ්‍රිතව විශේෂ සහයෝගිතාවක් ඇතිකර ගැනීම

• මෙරට සංචාරක ප්‍රවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා චීන රජය විසින් දැනටමත් නිර්දේශිත, වඩාත් ආකර්ෂණීය ගමනාන්ත 20 වැඩසටහන යටතේ ප්‍රමුඛතාව ලබාදීම පිළිබඳ සහතිකයක් ලබා ගැනීම හා චීන සංචාරකයින් වෙත නොමිලේ සංචාරක වීසා නිකුත් කිරීම මඟින් විශාල සංචාරක පිරිසක් ආකර්ෂණය කර ගැනීම

• ඛනිජ, මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විභවයන් සහිත ප්‍රදේශ කේන්ද්‍රියව, ඔප දමන ලද මැණික් මෙන්ම මැණික් ගල් යොදමින් අභරණ යනාදී භාණ්ඩ අපනයනය

ඉලක්ක කරගත් නව කර්මාන්ත වැඩසටහන් සඳහා දෙරටේ පෞද්ගලික අංශ ඒකාබද්ධව කර්මාන්ත ස්ථාපනය කිරීම මගින් පළාත් ආර්ථිකයන් ශක්තිමත් කිරීම

• චීන ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම කඩිනමින් ක්‍රියාත්මක කිරීම

• නුවරඑළිය, සීතාවක හා කෑගල්ල යන දිස්ත්‍රික්ක කේන්ද්‍රකොට ගත් හා අපනයන වෙළඳපල ඉලක්ක කරගත් කැපුමල් වගාව ප්‍රචලිත කිරීම සඳහා දෙරටේ පෞද්ගලික අංශ කේන්ද්‍රීයව සබඳතා ශක්තිමත් කරගැනීම



## 2.5 පාලන අංශය I සහ II

### 2.5.1 පාලන අංශයේ විශේෂ කාර්යයන්

අග්‍රාමාත්‍ය කාර්යාලයේ සමස්ත කාර්ය සාධනය ඉහළ ප්‍රමිතියකින් පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය පරිපාලන කටයුතු, මෙහෙයුම් කළමනාකරණය හා සම්බන්ධීකරණය යථාවත්ව සිදු කරනු ලබයි. තවද වර්තමානයේ රටේ පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි සියලු අංශ සඳහා අවම කාර්ය මණ්ඩලයක් පමණක් පවත්වාගෙන යමින් කාර්යාලීය කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත.

අතිශය සීමාකාරී රාජ්‍ය මූල්‍ය අවකාශයක් පැවැති 2023 වර්ෂය තුළ අග්‍රාමාත්‍ය කාර්යාලයීය වියදම් ප්‍රශස්ත අයුරින් කළමනාකාරණය කිරීමත් තුළින් වියදම් 46% කින් පමණ සීමාකිරීමට හැකියාව ලැබී ඇත. ඩිජිටල්කරණය කිරීම තුළින් කඩදාසි, තැපැල් හා සන්නිවේදන කටයුතු සඳහා යන පිරිවැය අවම කර ගැනීමටත් ඩිජිටල්කරණ ක්‍රියාවලියේ දී හඳුන්වාදෙන ලද නව කළමනාකරණ පද්ධති නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු තාක්ෂණ ඒකකය මානව සම්පත් භාවිතය මඟින්ම සිදු කරන ලද බැවින් බාහිර පාර්ශවයන් වෙත යොමු වීමට තිබූ වියදම් අවම කිරීමටද හැකියාව ලැබුණි.

### ❖ අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම

අග්‍රාමාත්‍ය කාර්යාලය සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායිව පරිහරණය මෙන්ම අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන්ට කාර්යක්ෂම හා සඵලදායි සේවාවක් ලබා දීම යන අරමුණු පෙරදැරි කරගෙන කාර්යාලයීය ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව මාණ්ඩලික නිලධරයන් වෙනුවෙන් ඵලදායිතා නියාමනය සහ ඵලදායිතා භාවිතය හා විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කර ඇත.

එමෙන්ම, ඵලදායිතා සම්මානලාභී පුද්ගලික ආයතනයක ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කළ අතර ඉදිරියේදී රජයේ ආයතනයකද ක්ෂේත්‍ර චාරිකාවක් ලබා දීමට සැලසුම් කර ඇත. එමඟින් කාර්යාලයේ නිලධරයන්ගේ ඵලදායිතා සංකල්පය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රයෝගික දැනුම ඵලදායීව ප්‍රයෝජනය ගැනීමට කටයුතු කිරීම තුළින් ඉදිරි වර්ෂයේදී ඵලදායිතා සම්මාන තරගාවලිය සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂා කෙරේ.

❖ **අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා ස්ථිර පදනමින් අනුමත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරීමේ වැඩසටහන**

පිරික්සුම් ලේඛනයක් සැකසීමෙන් අනතුරුව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබී ඇති සියලු ලිපිගොනුවල ඇතුලත් විය යුතු ලේඛනවල පවතින අඩුපාඩු හඳුනාගන්නා ලදි. එහිදී විශේෂයෙන්ම නිලධාරීන්ගේ පූර්ව සේවා ස්ථානවලට අදාල තොරතුරු ලිපිගොනු තුලට ඇතුලත්ව නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒවා කඩිනමින් සම්පූර්ණ කිරීමේ කටයුතු සිදු කර අවසන් කරන ලදි. මීට අමතරව පෞද්ගලික ලිපි ගොනු හිමියන් සෘජුවම විෂයභාර මාණ්ඩලික නිලධාරියකු ඉදිරියේ සිය පෞද්ගලික ලිපි ගොනුව සම්බන්ධයෙන් දැනුවත් කර අදාල අඩුපාඩු දැනුම් දීමත්, ලිපිගොනුව යාවත්කාලීනව පවත්වාගෙන යාමේ වැදගත්කමත් පහදා දීමටත් කටයුතු කරන ලදි. එමෙන්ම නිලධාරියකු ස්ථානමාරු වූ විට සතියක් ඇතුලත නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව නව සේවා ස්ථානය වෙත යොමු කිරීමට හැකිවන ලෙස කාර්යාලීය ක්‍රමවේදයන් කාර්යක්ෂම කරන ලදි.

## 2.5.2 තොරතුරු තාක්ෂණ අනු අංශය

රාජ්‍ය වියදම් පාලනය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීමට අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් කටයුතු කරනු ලබයි. තවද කටයුතු ඵලදායිව හා පහසුවෙන් ඉටු කිරීම සඳහා අභ්‍යන්තරව සකසන ලද මෘදුකාංග පද්ධති නිරන්තරයෙන් වැඩි දියුණු කිරීම හා නව තොරතුරු තාක්ෂණික භාවිතයන් අත්හදා බැලීම ද සිදුකරනු ලබයි. ඒ අනුව, නිවරදි තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට හා සයිබර් තර්ජනයන්ට මුහුණ දීමට හැකිවන පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලයේ සියලු දත්ත පද්ධති සඳහා සයිබර් ආරක්ෂණ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒවා නිරන්තරයෙන් අධීක්ෂණයට ද ලක් කරනු ලබයි.

ඒ අනුව ,

1. ජනතා කේන්ද්‍රීය පාලනයක් තහවුරු කරනු පිණිස ගරු අග්‍රාමාත්‍යවරයා හා අග්‍රාමාත්‍ය ලේකම්වරයා ප්‍රමුඛ අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් ගනු ලබන තීන්දු තීරණ හා ක්‍රියාදාමයන් පිළිබඳ තොරතුරු ජනතාව වෙත ලබාදීම උදෙසා අග්‍රාමාත්‍ය කාර්යාලීය නිල වෙබ් අඩවිය වන www.pmoffice.gov.lk නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සිදු කෙරේ .
2. වඩාත් විශ්වසනීය හා කාර්යක්ෂම නිල දත්ත සන්නිවේදනයක් තහවුරු කිරීම පිණිස අග්‍රාමාත්‍ය කාර්යාලීය ජාල පද්ධති හා ඊ මේල් සේවාදායකය කාලීනව යාවත්කාලීන කරනු ලබයි

3. අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු හා සයිබර් ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත “රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ”ක්‍රියාත්මක කරමින්, අභ්‍යන්තර චක්‍රලේඛ අංක ‘ 2023/1 :අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු හා සයිබර් ආරක්ෂාව සඳහා පරිශීලක වගකීම් ’හා අභ්‍යන්තර චක්‍රලේඛ අංක ‘ 2023/2 :සයිබර් සිද්ධි ප්‍රතිචාර සැලැස්ම ක්‍රියාත්මක කිරීම ’මැයෙන්

4. වන අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කළ අතර ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ද මේ වනවිට පවත්වනු ලැබ ඇත.

5. අග්‍රාමාත්‍ය කාර්යාලීය දත්ත පද්ධති බාධාකින් තොරව භාවිතා කිරීමේ හැකියාව තහවුරු කරනු පිණිස දත්ත ප්‍රතිසාධක අඩවියක් (DR Site) ස්ථාපනය කිරීමට අදාළ සේවාදායක පරිගණක වින්‍යාස කිරීම් සිදුකරමින් පවතී.

6. අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු වඩා කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීම සඳහා පහත දත්ත පද්ධති නිර්මාණය හා වැඩිදියුණු කිරීම සිදු කරන ලදී.

   i. අග්‍රාමාත්‍යවරයාගේ හදිසි පණිවිඩ රාජ්‍ය නිලධාරීන් වෙත දැනුම්දීම සඳහා කෙටි පණිවිඩ යැවීමේ (SMS) පද්ධතියක් නිර්මාණය කිරීම

   ii. WhatsApp හරහා මාර්ගගතව යොමු කරනු ලබන ප්‍රවාහන පහසුකම් ඉල්ලීම් පද්ධතිය වෙත සෘජුව ඇතුලත් කල හැකිවන පරිදි ප්‍රවාහන කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම

   iii. නොවිසඳුණු මහජන පැමිණිලි හා ගැටලු පිළිබඳ සිහිකැඳවීම් යැවීමට හැකි වන පරිදි ලිපි කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම

   iv. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා සමාලෝචන දත්ත ඇතුලත් කිරීමට හැකි වන පරිදි කළමනාකරණ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම

   v. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු පහසු කිරීම සඳහා QR කේත ක්‍රමයක් හඳුන්වා දීම මඟින් වත්කම් කළමනාකරණ දත්ත පද්ධතිය වඩා කාර්යක්ෂම කිරීම

   vi. මානව සම්පත් දත්ත කළමනාකරණ පද්ධතියක් හා ගබඩා කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමට මුලපිරීම

   vii. අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ලේකම් කාර්යාංශය සඳහා අත්හදා බලන පදනමින් කෘතිම බුද්ධි (AI) මෘදුකාංග ස්ථාපනය කර කාර්යාල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා මුල පිරීම

7. නිලධරයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වැඩි කිරීම සඳහා කාර්යාල මෘදුකාංග භාවිතය පිළිබඳව හා අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ අභ්‍යන්තරව සකසන ලද මෘදුකාංග පද්ධති භාවිතය පිළිබඳව පුහුණු සැසි මඟින් පුහුණු වීම් සිදු කරන ලදී.

8. රාජ්‍ය වියදම් අවම කිරීම සඳහා රාජ්‍ය අංශය නිවසේ සිට වැඩ කිරීමේ (Work From Home) සංකල්පයට අනුගත කිරීමේ ශක්‍යතාව අධ්‍යනය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස අග්‍රාමාත්‍ය කාර්යාලයේ මහජන සම්බන්ධතා අංශයේ කටයුතු නිවසේ සිට සිදු කිරීමට හැකි වන පරිදි දැනට භාවිතයේ පවතින ගොනු කළමනාකරණ පද්ධතිය (DMS) සඳහා අනුවර්තන නඩත්තුව (Adaptive Maintenance) සිදු කිරීම සඳහා අවශ්‍යතා විශ්ලේෂණය සිදු කිරීම හා කේතන කටයුතු ආරම්භ කරන ලදී.

9. ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය අංශයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණික ව්‍යාපෘති තිරසරව ක්‍රියාත්මකවීම ගැටළු සහගත වූ අවස්ථාවන්හී එම ව්‍යාපෘති අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අධ්‍යයනය කොට නිර්දේශ සැපයීම.

## ❖ ලේඛනාගාරයේ කටයුතු ඩිජිටල්කරණය කිරීම හා නව ලේඛනාගාරයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලේඛනාගාරය සඳහා 2023 වර්ෂයේ ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කරන ලදී. මෙම ලිපිගොනු කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වන්නේ අභ්‍යන්තර සේවාලාභීන්ට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම සඳහා පරිශීලන හිතකාමී ක්‍රමවේදයක් නිර්මාණය කිරීමයි. ලේඛනාගාරයේ ලිපිගොනු ඉල්ලීම් කිරීමේදි දත්ත පද්ධතිය මඟින් ඩොකට්ටුවේ ලිපිගොනු රඳවා ඇති ස්ථානය නිශ්චිතව හඳුනාගැනීමට හැකියාව ලැබීම හා ලිපිගොනුව නැවත භාර දීමේ දී ලිපිගොනුව රඳවා ඇති ඩොකට්ටුවේ ස්ථානය පහසුවෙන්ම හඳුනාගැනීමටත් මෙමඟින් හැකියාව ලැබී ඇත. දැනට ලේඛනාගාරයේ පවතින ලිපිගොනු 7000කට ආසන්න ලිපිගොනු ප්‍රමාණයක් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර එම ඩොකට්ටු හා ලිපිගොනු අදාළ පරිදි නාමකරණය හා අංකනය කර අවසන් කර ඇත. තවද, මාසිකව විවිධ අංශ මඟින් ලේඛනාගාරය වෙත ලිපිගොනු ලැබෙන අතර
දැනට ස්ථාපිත ලේඛනාගාරයේ ඉඩකඩ සීමිත බැවින් ඉදිරියේදී ලැබෙන ලිපිගොනු ගබඩා කිරීමට අමතරව ස්ථානයක් සකස් කිරීමේ වැඩකටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම ඩිජිටල්කරණය කරන ලද ලේඛනාගාරයක් ස්ථාපිත කිරීමේ අරමුණින් දැනට ලේඛනාගාරයේ ගබඩා කර ඇති ලේඛන පරිලෝකනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, ඉදිරියේදී එක් එක් අංශ වෙතින්
ලබාදෙන ලිපිගොනු පරිලෝකනය කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ මඟින් ඉඩකඩ ගැටලුවට ස්ථිර විසඳුමක් ලැබෙන අතර, ලිපිගොනු එහා මෙහා ගෙනයාමේ කාලය

ද අවම වේ. අදාළ විෂය නිලධරයාට මුර පදයක් ලබා දීම මගින් පහසුවෙන්ම නැවත පරිලෝකිත ලිපිගොනුව අවශ්‍ය අවස්ථාවන්හි දී භාවිත කිරීමේ පහසුව සලසා දීම ද මෙමගින් අපේක්ෂා කරයි.

### ❖ ලේඛන කළමනාකරණ පද්ධතිය භාවිතයට ගැනීම

අග්‍රාමාත්‍ය කාර්යාලයේ තැපැල් ඒකකය මඟින් යොමු කරනු ලබන ලිපි ගනුදෙනු කිරීමේ කටයුතු ලේඛන කළමනාකරණ පද්ධතිය (Document Management System) භාවිතයෙන් සිදු කරනු ලබයි.

## 2.5.3 ප්‍රවාහන හා නඩත්තු ඒකක

### ❖ ප්‍රවාහන කටයුතු

- ඇණියේ පවතින වාහන නඩත්තුව යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- වාහන අලුත්වැඩියා අවශ්‍යතාවලදී දේශීය නියෝජිත වෙතින් කරනු ලබන අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ බාහිර ආයතන මඟින් සිදුකරන අලුත්වැඩියාවන්හි ප්‍රසම්පාදන කටයුතු සඳහා ගිණුම් අංශය වෙත යොමු කිරීම.
- වාහන ආදායම් බලපත්‍ර සහ රක්ෂණාවරණ නියමිත කාලයට ලබා ගැනීම.
- අවස්ථාවෝචිත පරිදි කාර්ය මණ්ඩලය සහ රියදුරුමහතුන් සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.
- සංචිත වාහන වෙන්කිරීම සඳහා whatsapp මඟින් ක්‍රියාත්මක පෝරමයක් හඳුන්වා දී ඇති අතර ඒ මඟින් වාහන වෙන් කිරීම සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙහිදී මතුවන ගැටලු හඳුනාගනිමින් හා දෝෂ අවම කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

### ❖ නඩත්තු කටයුතු

- සිරිමතීපාය පරිශ්‍රය වටා අබලන්ව පැවති වැට සහිත තාප්පයෙහි යකඩ වැට කොටස ගලවා ඉවත්කර අලුතින් සකස් කිරීම.
- අරලියගහ මන්දිරය, සිරිමතීපාය හා නුවරඑළිය අගමැති මන්දිරයන්හි උද්‍යාන භූමි සහ ගොඩනැගිලි තුළ කෞතුක හා ඉපැරණි බව ආරක්ෂා කරමින් නඩත්තු කටයුතු සිදු කිරීම.

- 2022 වර්ෂයේ පැවති අරගල තත්ත්වය නිසා විනාශයට පත්වූ අරලියගහ මන්දිර පරිශ්‍රය හා සිරිමතිපාය පරිශ්‍රය පිළිසකර කිරීම.
- අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් ගොඩනැගිලිවල විදුලි, වායු සමීකරණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ජලය ඇතුළු එදිනෙදා නඩත්තු කටයුතු ඉටු කිරීම.
- අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රවල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.
- අරලියගහ මන්දිර පරිශ්‍රයේ පිහිටි මහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 10800 කින් යුත් වහලය සින්ක් ඇලුමිනියම් තහඩු යොදා අලුත්වැඩියා කිරීම.
- අරලියගහ මන්දිර පරිශ්‍රයේ පිහිටි වර්ග අඩි 40000 කින් යුත් ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකර වීම හා එහි නඩත්තු කටයුතු සිදු කිරීම.
- සමාජ සුභසාධන කටයුතු වලදී පිළිසකර කිරීම් ආදියට සහය වීම.
- ඉදිකිරීම් නඩත්තු සැලසුම් සකස් කිරීම.

## ❖ උද්‍යාන කළමනාකරණ කටයුතු

- උද්‍යාන භූමි තුළ ඇති වටිනාකමක් සහිත සිහිවටන ශාඛ ආරක්ෂා කිරීම සහ ඒවායේ නාමපුවරු සවිකිරීම.
- අරලියගහ මන්දිරය නැරඹීමට පැමිණෙන පාසැල් ළමුන් සඳහා ඖෂධ හෝ වටිනාකමින් යුත් පැලයක් ලබා දීමට කටයුතු කිරීම.
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ හා නිළ නිවාස පරිශ්‍රයන්හි උද්‍යාන සැලසුම් කිරීම, ශාක වර්ග ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම, ශාක සංරක්ෂණය හා උද්‍යාන නඩත්තු කිරීම.

# 2.6 ගිණුම් අංශය

## 2.6.1 ගිණුම් අංශයේ කාර්යභාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ව්‍යවස්ථාපිතව පැවරී ඇති කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යහපත් හා මනා මූල්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම හා යහපත් මූල්‍ය වාර්තාකරණයක් තහවුරු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

ඒ අනුව මෙම අංශය මඟින් පහත දැක්වෙන කාර්යයන් සිදු කරනු ලබයි.

- මූල්‍ය සැලසුම්කරණය හා අයවැය පාලනය
- ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කර වත්කම් මිලදී ගැනීම, නඩත්තු කිරීම, එම වත්කම් ආරක්ෂා කිරීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා වත්කම් සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කිරීම
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, කළමනාකරණ වාර්තා සකස් කිරීම හා රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් " B " ගිණුමේ සීමාවන් පවත්වාගෙන යමින් අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් වාර්ෂික සැසඳුම් වාර්තා පිළියෙල කිරීම
- රජයේ විගණන නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කර වාර්ෂික විගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු හා අවශ්‍ය සහාය ලබා දීම
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ සියලු නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම, අත්තිකාරම් හා වෙනත් දීමනා ගෙවීම ඇතුලු පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම
- කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය පාරිභෝජන ද්‍රව්‍ය මිල දී ගැනීම හා එම ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොග පාලන කටයුතු සිදු කිරීම

## 2.6.2 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රගතිය

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 02 යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ වියදම් දැරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

2023 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 889.50 ක් ද, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් මිලියන 248.00 ක් ද ලෙස සමස්ත ප්‍රතිපාදන රුපියල් මිලියන 1,137.50 ක් වෙන්ව ඇත.

2023.01.01 දින සිට 2023.12.31 දිනට ව්‍යාපෘතිගත ප්‍රතිපාදන වල මූල්‍ය ප්‍රගතියේ සාරාංශය පහත පරිදි වේ.

| ව්‍යාපෘතිය / උප ව්‍යාපෘතිය | මුළු ප්‍රතිපාදනය 2023 වර්ෂය (රු.මි.) | | මූල්‍ය ප්‍රගතිය 2023 වර්ෂය (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | | ප්‍රාග්ධන | |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | **483.85** | **93.90** | **430.83** | **89.04%** | **92.55** | **98.56%** |
| සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා | **405.65** | **154.10** | **402.22** | **99.15%** | **150.95** | **97.96%** |
| එකතුව | **889.50** | **248.00** | **833.05** | **93.65%** | **243.50** | **98.19%** |

ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා වෙන් කර ඇති ව්‍යාපෘති යටතේ අරලියගහ මන්දිර පරිශ්‍රය, අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රය සහ නුවරඑළිය අග්‍රාමාත්‍ය නිල නිවස අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සිදු කිරීම හා පරිපාලන කටයුතු, සැපයුම් කටයුතු, නඩත්තු කටයුතු සඳහා වූ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීම් සිදු කර ඇත.

## 2.7අභ්‍යන්තර විගණන අංශය

### 2.7.1 අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරන ලද කාර්යයන්

අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් ඉදිරිපත් කිරීමට නියෝග ලබා දෙන විගණන වාර්තා ලබා දීම, ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තා ජාතික විගණන කාර්යාලය හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා එම ආයතනවල මාර්ගෝපදේශකත්වයට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අග්‍රාමාත්‍ය කාර්යාලයේ විගණන ඒකකය විසින් නියමිත කාලරාමු තුළ සිදු කරනු ලබයි.

<u>වසරේ පළමු කාර්තු තුන අවසානය දක්වා සිදු කරන ලද විගණන කළමනාකරණ කාර්යයන්</u>

| # | ක්‍රියාකාරකම | දිනය |
|---|---|---|
| 1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශන්ට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම<br>• පළමුවන විගණන හා කළමනාකරණ රැස්වීම<br>• දෙවන විගණන හා කළමනාකරණ රැස්වීම<br>• තෙවන විගණන හා කළමනාකරණ රැස්වීම<br>• සිව්වන විගණන හා කළමනාකරණ රැස්වීම | 2023.02.28<br>2023.06.16<br>2023.10.24<br>2023.12.15 |
| 2 | ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ඇගයීම් වාර්තාව කාර්තුමය වශයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යැවීම<br>• 2022 සිව්වන කාර්තුව සඳහා ඇගයීම් වාර්තාව යවා ඇත<br>• 2023 පළමු කාර්තුව සඳහා වාර්තාව යවා ඇත<br>• 2023 දෙවන කාර්තුව සඳහා තක්සේරු වාර්තාව යවා ඇත<br>• 2023 තුන්වන කාර්තුව සඳහා ඇගයීම් වාර්තාව යවා ඇත | 2023.01.23<br>2023.04.28<br>2023.07.27<br>2023.10.19 |
| 3 | 2009.06.09 දිනැති අංක: DMA/2009(1) දිනැති විගණන සහ කළමනාකරණ චක්‍රලේඛ අනුව කාර්තුමය වාර්තා ජාතික විගණන කාර්යාලය වෙත යැවීම | 2023.01.30<br>2023.03.31 |
| 4 | කාර්තුමය වශයෙන් අභ්‍යන්තර විගණන වාර්තා (අනුකූලතා වාර්තාව,ආකෘතිය 6) | |

| # | ක්‍රියාකාරකම | දිනය |
|---|---|---|
| | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යැවීම<br>• කාර්තුමය අනුකූලතා වාර්තාව ඉදිරිපත් කිරීම -පළමු කාර්තුව<br>• කාර්තුමය අනුකූලතා වාර්තාව ඉදිරිපත් කිරීම - දෙවන කාර්තුව<br>2023 සිව්වන කාර්තුව සඳහා අනුකූලතා වාර්තාව ඉදිරිපත් කිරීම | 2023.03.08<br>2023.07.11<br>2023.12.21 |
| **5** | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ විගණන නිරීක්ෂණ නිර්දේශ සහිතව අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත වාර්තා කිරීම. | 2023.02.23<br>2023.02.24<br>2023.03.31<br>2023.06.26<br>2023.06.30<br>2023.09.25<br>2023.09.27 |
| **6** | ගෙවීම් වව්චර් පරීක්ෂා කිරීම | 2023 වර්ෂය සඳහා පරීක්ෂා කර ඇත |
| 7 | අග්‍රාමාත්‍ය ලේකම් විසින් ලබා දෙන උපදෙස් පරිදි විශේෂ විගණනයන් සිදු කිරීම | 2023.10.06 |
| 8 | 2009.06.09 දිනැති අංක : DMA/2009(1) දිනැති විගණන හා කළමනාකරණ චක්‍ර ලේඛයට අනුව කාර්තුමය වාර්තාව ජාතික විගණන කාර්යාලය වෙත යැවීම. | 2023.10.20 |
| 9 | 2024 වර්ෂය සඳහා අවධානම් ලේඛනය පිළියෙල කිරීම | 2023.11.28 |
| **10** | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සහ විගණන නිරීක්ෂණ නිර්දේශ සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත වාර්තා කිරීම. | 2023.11.30<br>2023.12.04<br>2023.12.05 |
| **11** | අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය පිළියෙල කිරීම | 2023.12.13 |

## 2.8 මාධ්‍ය අංශය

### 2.8.1 මාධ්‍ය අංශයේ කාර්යභාරය හා ක්‍රියාකාරිත්වය

ගරු අග්‍රාමාත්‍යවරයා, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ගරු අග්‍රාමාත්‍යවරයා යටතේ පවතින අමාත්‍යාංශ මඟින් සිදුකරනු ලබන සංවර්ධන හා සමාජයීය කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා විධිමත්, ක්‍රමවත් සහ බලාත්මක මාධ්‍ය භාවිතයක් සිදු කිරීම අවශ්‍ය වේ. තවද රජයේ සංවර්ධන ක්‍රියාදාමය සහ ගරු අග්‍රාමාත්‍යවරයා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් ගනු ලබන නිවැරදි තීන්දු තීරණ පිළිබඳ සත්‍ය තොරතුරු ජනතාවට සමීප කිරීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.
මාධ්‍ය හා සන්නිවේදන කටයුතු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සිදු කිරීම සඳහා පහත කටයුතු සිදු කරනු ලබයි.

• ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගී වන නිල උත්සව වල මාධ්‍ය ආවරණයන් හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

• මාධ්‍ය විමර්ශනය කරමින් දැනුවත් කළ යුතු මාධ්‍ය පළවීම් පිළිබඳව ගරු අග්‍රාමාත්‍යවරයා, අග්‍රාමාත්‍ය ලේකම්වරයා ඇතුළු දැනුවත් කළ යුතු පාර්ශවයන් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීම

• දර්ශන, ඡායාරූප, වාර්තා සංරක්ෂණය කිරීම

• අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය තුල ප්‍රවෘත්ති යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම

• ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගීවන ජාතික වැදගත්කමක් සහිත විශේෂ වැඩසටහන් වලදී සජීවී විකාශන කටයුතු සම්බන්ධීකරණය (live) හා එවැනි අවස්ථාවල මාධ්‍ය නිවේදන නිකුත් කිරීම

• දෙස් විදෙස් මාධ්‍ය ආයතන, රාජ්‍ය මාධ්‍ය ප්‍රධානින් හා මාධ්‍යවේදීන් පිළිබඳ තොරතුරු ලේඛණයක් පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය. (නම,දුරකථන අංකය, විද්‍යුත් ලිපිනය, වට්ස් ඇප් අංකය, පෞද්ගලික ලිපිනය ආදී)

• ගරු අග්‍රාමාත්‍යවරයා හා අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළව මාධ්‍ය භාවිතයන් පිළිබඳව අවශ්‍ය වූ අවස්ථාවලදී නීතිමය පියවර ගැනීම සඳහා සම්බන්ධීකරණය සිදු කිරීම

• අග්‍රාමාත්‍ය කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සිදු කෙරෙන ජාතික මට්ටමේ ව්‍යාපෘතිවල ප්‍රචාරණ කටයුතු සිදු කිරීම

• ගරු අග්‍රාමාත්‍යවරයාගේ පණිවිඩ (සුභ පැතුම්/ශෝක/විශේෂ දින) සම්බන්ධීකරණය සහ මාධ්‍ය වෙත නිකුත් කිරීම

• ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ජාතික වශයෙන් වැදගත් අවස්ථාවල සහ සංවර්ධන ව්‍යාපෘතිවල වාර්තා වැඩසටහන් (Documentary) නිෂ්පාදනය කිරීම

## 01. ශුභාශිංසන පණිවිඩ හා ශෝක පණිවිඩ

විහාරස්ථානවල මැදිහත්වීමෙන් මෙරටදී හා විදේශයන්හීදී සිදුකරනු ලබන විවිධ උත්සව, ගෞරවනීය ස්වාමීන් වහන්සේලා විෂයෙහි නායක පදවි අක්ත පත්‍ර ප්‍රධානය කිරීම සහ විශේෂ අවස්ථා පදනම් කර ගනිමින් ශුභාශිංසන පණිවිඩ නිකුත් කිරීම, ස්වාමීන් වහන්සේනමකගේ හෝ ආගමික නායක පූජකතුමන්ලාගේ අපවත් වීමකදී අග්‍රාමාත්‍යවරයාගේ සංවේගය පළ කිරීම සඳහා එතුමාගේ අත්සනින් ශෝක පණිවිඩ නිකුත් කිරීමද අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් නිරන්තරව සිදු කරනු ලබයි.

## 02. බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් විශේෂ ආගමික උත්සව සංවිධානය කිරීම

ගරු අග්‍රාමාත්‍යවරයාගේ සහභාගිත්වයෙන් හා ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සංවිධානය කරනු ලබන විශේෂ ආගමික වැඩසටහන් සංවිධානය කිරීමත් ඒ සඳහා පහසුකම් සැපයීමත් අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. එමෙන්ම 2023 වර්ෂයේ බුද්ධරශ්මි ජාතික වෙසක් කලාපය මැයි මස 05, 06, සහ 07 දිනවල දී කොළඹ ගංගාරාම විහාරස්ථානය, ජනාධිපති කාර්යාලය සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධානත්වයෙන් ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු යොදන ලද අතර ජාතික ඉෆ්තාර් උත්සවයද අරලිය ගහ මන්දිරය කේන්ද්‍රීයව පවත්වන ලදී.





## 03. සංකථන මණ්ඩපය

සබුද්ධික සහ විචක්ෂණශීලී ප්‍රජාවක් නිර්මාණය කිරීමේ අරමුණින් අග්‍රාමාත්‍යවරයාගේ සංකල්පයක් අනුව ආරම්භ කළ "සංකථන මණ්ඩපය" අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබයි. ඓතිහාසික, දේශපාලනික, කලා සහ සාහිත්‍ය වැනි අංශ වල කාලීනව වැදගත් මාතෘකා ඔස්සේ සමාජය තුළ කථිකාවතක් නිර්මාණය කිරීමට මේ මඟින් කටයුතු කෙරේ. ඒ ඒ ක්ෂේත්‍රවල විද්වතුන්, විශ්වවිද්‍යාල හා පාසල් සිසුන්, ආගමික නායකයින් හා විවිධ සංවිධාන නියෝජනය කරන පිරිස් සම්බන්ධ කරගනිමින් සංකථන මණ්ඩපය පවත්වනු ලැබේ.

## 04. ධර්මදීපනි පොහෝ දින ධර්ම දේශනා වැඩසටහන

ගරු අග්‍රාමාත්‍යවරයාගේ සංකල්පයකට අනුව ප්‍රඥාසම්පන්න දැහැමි ජන සමාජයක් උදෙසා, "**ධර්මදීපනී**" ධර්ම දේශනා මාලාව සෑම පුන් පොහෝ දිනකම දිවයිනේ ප්‍රසිද්ධ ධර්ම දේශකයාණන් වහන්සේ නමක් වැඩම කරවා ගරු අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පවත්වනු ලබයි. මෙම අනගි ධර්ම දේශනාවන් ශ්‍රවණය කිරීම සඳහා දිවයිනේ විශ්වවිද්‍යාල, පාසල්, දහම්පාසල් දරුදැරියන් සහ විවිධ සංවිධානවල පිරිස් සහභාගී කරවීමට අග්‍රාමාත්‍ය කාර්යාලය කටයුතු කරනු ලබයි.



# 2.9 නීති අංශය

## 2.9.1 නීති අංශයේ කාර්යභාරය

ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විවිධ නෛතික කාර්යයන්ට අදාළ සම්බන්ධීකරණ කටයුතු මෙන්ම ගරු අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍යධුර දරනු ලබන අමාත්‍යාංශවලට අදාළ නීතිමය කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලබන අතර, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හා වෙනත් අධිකරණයන්හි විටින් විට ගොනු කෙරෙන ගරු අග්‍රාමාත්‍යවරයා සහ අග්‍රාමාත්‍ය ලේකම්වරයා වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් පැවරෙන නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලබයි.

• 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වූ කාලය තුළ නීති අංශය වෙත ලැබී ඇති නඩු පැවරීම්වලට අදාළ නොතීසි ප්‍රමාණය පහත පරිදි වේ.

| | |
|---|---|
| 1.ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගොනු | -46 |
| 2.අභියාචනාධිකරණ නඩු ගොනු | - 08 |
| එකතුව | -54 |

• ඉහත දක්වන ලද සියලු නඩු ගොනු ආශ්‍රිත කාර්යයන් සම්පූර්ණ කර ඇති අතර, අදාළ පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද, අවශ්‍ය අවස්ථාවලදී, ගරු නීතිපතිතුමා වෙත නිරීක්ෂණ හා පිළිතුරු ලබා දී ඇත.

• ගරු අග්‍රාමාත්‍යවරයා සහභාගීවන නීති කටයුතු සම්බන්ධයෙන් වන රැස්වීම්, විශේෂ හමුවීම් ආදිය සම්බන්ධයෙන් අපේක්ෂිත සහයෝගය ලබා දීමට කටයුතු කර ඇත.

• ගරු අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි සහයෝගය ලබා දීමට කටයුතු කර ඇත.

• අග්‍රාමාත්‍ය කාර්යාලයේ බද්දට ගැනීමට යෝජිත ගොඩනැඟිලි පරිශ්‍රයන් හි බදු ගිවිසුම් කෙටුම්පත් හා වෙනත් ගිවිසුම් කෙටුම්පත් විශ්ලේෂණය කර නිර්දේශ ඉදිරිපත් කර ඇත.

• නීති අංශය වෙත ඉදිරිපත් කරන ලද විවිධ ලිපිගොනු නිරීක්ෂණය කර ඊට අදාළ සටහන් සහ නිර්දේශ අදාළ අංශ වෙත ලබාදීමට කටයුතු කර ඇත.



## 2.10 මහජන සම්බන්ධතා අංශය

### 2.10.1 මහජන සම්බන්ධතා අංශයේ විශේෂ කාර්යයන්

ගරු අග්‍රාමාත්‍යවරයා වෙත යොමු වන මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි ඉතා කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම මහජන සම්බන්ධතා අංශය විසින් සිදු කරනු ලබයි. ඒ යටතේ පහත සඳහන් පරිදි කටයුතු සිදු කරනු ලැබේ.

• මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි කඩිනමින් ඉටුකරදීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම

• මහජන ඉල්ලීම් සහ අවශ්‍යතාවයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය සොයා බැලීම

• මහජන ගැටලු විසඳීම සඳහා රාජ්‍ය ආයතන සමඟ ශක්තිමත් සම්බන්ධීකරණයක් ගොඩනැඟීම

• දත්ත කළමනාකරණ පද්ධතිය හරහා මහජන සම්බන්ධතා අංශය වෙත ලැබෙන ඉල්ලීම් වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව අදාළ අංශ වෙත යොමු කිරීම, එම කාර්යය නිසි පරිදි කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සිදු කිරීම හා අදාළ දත්ත විශ්ලේෂණය කර වාර්තා සැකසීම



## 01. යෝජනා, ඉල්ලීම් හා දුක්ගනිවිලි කාර්යක්ෂමව යොමු කිරීම සඳහා තාක්ෂණික හා සන්නිවේදන ක්‍රමෝපායන්ගේ භාවිතය

යෝජනා, ඉල්ලීම් හා දුක් ගැනවිලි ඵලදායී ලෙස ඉටු කිරීම පිණිස තාක්ෂණික හා සන්නිවේදන ක්‍රමෝපායන් භාවිතා කරනු ලබන බැවින් ඕනෑම පුද්ගලයෙකුට තම ඉල්ලීම තැපෑල මගින් යොමු කිරීමට අමතරව පහත දැක්වෙන සබැඳි හරහා විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකිය. එසේම එම යොමු කිරීම් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම ද සිදු කරනු ලැබේ.

- secretarypr@pmoffice.gov.lk
- www.pmoffice.gov.lk (Public grievances වෙබ් පිටුවේ සබැඳිය)
- 0117481514

## 02. කෙටි පණිවුඩ සේවාව

යොමු කරන ඉල්ලීම් හා දුක් ගැනවිලි සමඟ ජංගම දුරකථන අංකයන් සඳහන් කර ඇත්නම්, ඒ සඳහා යොමු අංකයන් (Reference Number) සහිත කෙටි පණිවුඩයක් කෙටි පණිවුඩ සේවාව (SMS) මගින් ලබා දීමට කටයුතු යොදා ඇත.



## 03. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ප්‍රතිපාදන බල ගැන්වීම

මහජනතාව විසින් යොමු කරනු ලබන සෑම ඉල්ලීමකට අදාළ ලේඛන පරිලෝකනය කර (Scan) මෘදු පිටපත් (Soft Copies) ලෙස ලිපි කළමනාකරණ පද්ධතියක් (Document Management System) තුළ ගබඩා කෙරේ. එමඟින් තොරතුරු පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය ඕනෑම මොහොතක තොරතුරු නැවත ලබා ගැනීමට හැකියාව ඇත. ඒ අනුව 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ප්‍රතිපාදන බලගන්වා ඇත.

<u>2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 ගරු අග්‍රාමාත්‍යතුමන් වෙත ඉදිරිපත් වූ මහජන ඉල්ලීම් හා දුක්ගැනවිලි ආශ්‍රිත සාරාංශය</u>

| # | මාධ්‍යය | සංඛ්‍යාව |
|---|---|---|
| i. | ලියාපදිංචි තැපැල | 8,585 |
| ii. | සාමාන්‍ය තැපැල | 6,877 |
| iii. | විද්‍යුත් තැපැල/ වට්ස්ඇප්/ ටෙලිමේල් | 3,847 |
| iv. | අතින් | 2,404 |
| v. | ෆැක්ස් | 118 |
| vi. | අභ්‍යන්තර ලිපි | 47 |
| | **මුළු එකතුව** | 21,878 |



**අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත 2023.01.01 දින සිට 2023.12.31 දක්වා වූ කාල පරාසය තුළ ලද මහජන ඉල්ලීම් ක්ෂේත්‍ර අනුව කරන ලද වර්ගීකරණය**




මෙම වර්ෂය තුළ මහජනතාව විසින් යොමු කරනු ලැබූ යෝජනා, ඉල්ලීම්/ දුක් ගැනවිලි අදාල අමාත්‍යාංශ සහ ආයතන වෙත යොමු කර අවසන් පිළිතුර ලැබෙන තෙක් නිරන්තර පසුවිපරම් සිදු කරමින් අවසන් පිළිතුරු ලද ඉල්ලීම් සංඛ්‍යාව 685 කි

## 05. අංකිත අත්සන (Digital Signature) භාවිතා කිරීම

සාම්ප්‍රදායි ක ලිපි ගොනු වෙනුවට අංකිත අත්සන යෙදූ විද්‍යුත් ලිපි යැවීම තුළින් මහජන සේවාවන්හී කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය වැඩි කිරීමට කටයුතු යොදා ඇති අතර, එම සේවාව ලබාගන්නා පුද්ගලයින් සඳහා විද්‍යුත් තැපැල හා Whatsapp අංකය භාවිතයෙන් ප්‍රතිචාර දැක්වීමට ද අවස්ථාව උදාකර දී ඇත. එමඟින්, කඩදාසි භාවිතය අවම කිරීමට හා ලිපි ද්‍රව්‍යය

සඳහා වන පිරිවැය අවම කර ගැනීමට ද හැකියාව ලැබී ඇත අතර, ලිපි ලේඛනයන්හී සුරක්ෂිතභාවයද තහවුරු කොට ඇත



## 04. මහජන ඉල්ලීම්/ දුක් ගැනවිලි කඩිනමින් ප්‍රතිචාර දැක්වීම/ විසඳීම සඳහා සෘජු අධීක්ෂණ නිලධාරීන් පත්කරවා ගැනීම

අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් වන මහජන ගැටළු සඳහා කර්යක්ෂමව කටයුතු කිරීම පිණිස සියලු "අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් සභා අමාත්‍යාංශවලින් නිලධාරීන් පත් කොට ඇති අතර, ඉදිරියේ දී සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ද අධීක්ෂණ නිලධාරීන් පත් කිරීමට පියවර ගත යුතුය.

1. මෙම ක්‍රියාවලිය තුළින් සෑම ඉල්ලීමක්ම අදළ ආයතන වෙත යොමු කරනුල ලබන්නේ විද්‍යුත් තැපැල (Email) පමණක් වන බැවින්, එමඟින් ලිපි ද්‍රව්‍ය හා තැපැල් වියදම් 50% කට වැඩි ප්‍රමාණයකින් වියදම් අඩු කිරීමට හැකියාව ලැබී ඇත.

2. ඉල්ලීම් යොමුකරනු ලබන පුද්ගලයා සතුව විද්‍යුත් තැපැල් ලිපිනයක් (Email) පවතී නම් අදාළ පිළිතුරු හා ලිපි හුවමාරුව විද්‍යුත් තැපැල මඟින් සිදු කිරීමට කටයුතු යොදා ඇත.

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම්
(ආයතනික වගවීම)

දීපා ලියනගේ
අතිරේක ලේකම් (සංවර්ධන I)
(අධීක්ෂණය හා නියාමනය)

ඒ වී ඒකනායක
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
(සැකැස්ම හා සංස්කරණය)

# 03

# වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

අග්‍රාමාත්‍ය කාර්යාලය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | තත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 923,549,000 | 1,073,760,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 11,318,581 | 27,497,161 | ඒසීඒ-4 |
| | 8.3.1 | ස්ත්‍රී පුරුෂභාවයට අනුව කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය |
| **8.2** | | විවිධාංගීකරණයතාක්ෂණය ඉහළ නැංවීම , |
| **10.2** | | ආගම ,ජාතිය ,ජන වර්ගය ,ආබාධිතබව ,ලිංගිකත්වය ,වන විට වයස 2030 හෝ ආර්ථික හෝ වෙනත් තත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියළු දෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහප්‍රවර්ධනය කිරීම |
| **10.7** | | හොඳින් කළමනාකරණය කරන ලද සහ සැලසුම් කරන ලද ආකාරයට සංක්‍රමණ කටයුතු ක්‍රියාවට නැංවීමද ඇතුලත්ව වගවීමෙන් යුක්තවමනාව , ආරක්ෂාකාරීව ජනතාවට ඔබ මොබ යාමේ සහ සංක්‍රමණය ,සංවිධානගතව වීමේ පහසුකම් සැලසීම |
| | 10.7.2 | හොඳින් කළමනාකරණය වන සංක්‍රමණික ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව |
| **11.2** | | විශේෂයෙන්ම අවධානමට ලක්විය හැකි තත්වයේ සිටින කාන්තාවන් , ආබාධ සහිත පුද්ගලයන් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ ,ළමුන් පොදු ,අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින්ව්‍යාප්ත කිරීම මඟින් වන විට 2030 සියලුමදෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබාගත හැකි ප්‍රවේශවිය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම |
| | 11.2.1 | ස්ත්‍රී පුරුෂභාවයවයස සහ ආබාධ සහිත අය යන සාධක මත පොදු ප්‍රවාහන , පහසුකම් පහසුවෙන් ලබාගත හැකි ජනගහනයේ පංගුව |

| අදාළ ගෝලීය ඉලක්ක | අදාළ ගෝලීය දර්ශකය | හැඳින්වීම |
|---|---|---|
| **11.7** | | වන 2030විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ටවයස්ගත , පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරීවන සියලු දෙනා අන්තර්ගත වූ සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම |
| | 11.7.1 | ස්ත්‍රී පුරුෂභාවයවයස සහ ආබාධ සහිත පුද්ගලයින් යන කරුණු අනුව , නගරවල මහජනභාවිතයට ඇති විවෘත අවකාශ අතරින් ගොඩනගන ලද ප්‍රදේශයන්හි සාමාන්‍ය පංගුව |
| **11.අ** | | ජාතික සහ කලාපීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කිරීම මඟින් නාගරික , උප නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ධනාත්මක ආර්ථික සමාජයීය සහ පරිසරාත්මක සම්බන්ධතාවලට සහාය දැක්වීම |
| | 11.අ.1 | නගර ප්‍රමාණය අනුව ජනගහන ප්‍රක්ෂේපණයන් සහ සම්පත් අවශ්‍යතාවයන් ඒකාබද්ධ කරමින් සිදු කරන නගර සහ ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරණු ලබන නගරයන්හි ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය |
| **12.8** | | වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාට තිරසාර සංවර්ධනය 2030 හා ස්වභාවධර්මය සමගසුසංයෝගයෙන් යුත් ජීවන රටාවන් ගත කිරීම පිළිබඳව දැණුවත්භාවයක් සහ ඊට අදාල තොරතුරු ලැබී තිබීම තහවුරු කිරීම |
| | 12.8.1. | ගුරු අධ්‍යාපනය සහ (ඇ) විෂය මාලා (ආ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති(අ) ) ශිෂ්‍ය ඇගයීම් කෙතරම් දුරට (ඈ)1ගෝලීය පුරවැසිභාවය ( ) පිළිබඳඅධ්‍යාපනය සහ11ත (ෟරසර සංවර්ධනය දේශගුණික විපර්යාස ) යන අංශයන් තුළට ප්‍රවාහානුගතකර ( පිළිබඳ අධ්‍යාපනයද ඇතුළත්ව තිබේද යන්න |
| **14.ඇ** | | “අපට අවශ්‍ය අනාගතය )The Future We Want) “හි වන ඡේදයේ 158 සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණයට සහ තිරසර ,සඳහන් කර ඇති පරිදි අන්දමින් භාවිතා කිරීමට නීතිමය වැඩ සැලැස්මක් සපයන්නා වූ නීති අනුව සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම වැඩි දියුණු කිරීම |
| **15.1** | | වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර 2020 ,විශේෂ වනාන්තර ,පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්කඳු සහ වියලි බිම් අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය , අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම නැවත නගා සිටුවීම සහ තිරසර |
| **15.2** | | සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනයවිනාශ වූ වනාන්තර යථා තත්වයට ,වන විනාශය නැවැත්වීම , පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපනය සහ නැවත වන වගාව වර්ධනය කිරීම |
| | 15.2.1 | තිරසර වනාන්තර කළමනාකරණය සම්බන්ධයෙන් වන ප්‍රගතිය |
| **15.අ** | | ජෛව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස් කිරීමට උනන්දු කිරීම සහ කැපී පෙනෙන ලෙස වැඩි කිරීම |

| අදාළ ගෝලීය ඉලක්ක | අදාළ ගෝලීය දර්ශකය | හැඳින්වීම |
|---|---|---|
| | | |
| | 15.අ.1 | ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන නිළ සංවර්ධන ආධාර සහ රාජ්‍ය වියදම් |
| **16.7** | | සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක ,සියලු දෙනා අන්තර්ගත වූ , සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන්යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම |
| | 16.7.2 | ස්ත්‍රී පුරුෂභාවයහා ජන කණ්ඩායම් අනුව වයස සහ ආබාධ සහිත බව , තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තමන්ද අන්තර්ගත බවට සහ තම අදහස්වලට ප්‍රතිචාර දක්වන බවට විශ්වාසයක් සහිත ජනගහනයේ ප්‍රමාණය |
| **17.1** | | බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය |
| | 17.1.1 | මූලාශ්‍රය අනුව දළ දේශීය නිෂ්පාදනයෙන් පංගුවක් ලෙස සමස්ථ රාජ්‍ය ආදායම |
| | 17.1.2 | දේශීය අයවැයෙන් දේශීය බදු ආදාමමෙහි පංගුව |
| **17.7** | | එකිනෙකා සමඟින් සාකච්ඡාවෙන් ඇතිකර ගත් එකඟතාවයන් අනුව වරණීය සහ සහණදායී වාසිදායී කොන්දේසි අනුව පරිසර හිතකාමී තාක්ෂණයන් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙනුවෙන් සංවර්ධනය කිරීම |
| | 17.7.1 | පරිසර හිතකාමී තාක්ෂණයන් සංවර්ධනයප්‍රචාරණය සහ ,හුවමාරුව , ප්‍රවර්ධනය වෙනුවෙන්සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සඳහා අනුමත මූල්‍යාධාර සමස්ථ ප්‍රමාණය |
| **17.8** | | අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු හා විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම |
| | 17.8.1 | අන්තර්ජාලය භාවිතයට ගන්නා පුද්ගලයන් ප්‍රමාණය |
| **17.13** | | ප්‍රත්පත්ති සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්ති සංගතභාවය තුලින් ජගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම |
| **17.14** | | තිරසාර සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සංගතභාවය වැඩිදියුණු කිරීම |
| | 17.14.1 | තිරසර සංවර්ධනයෙහි ප්‍රතිපත්තිමය බැඳීම් ඉහළ නැංවීම පිණිස ක්‍රියාත්මක යාන්ත්‍රණයන් සහිත රටවල් සංඛ්‍යාව |
| **17.15** | | දරිද්‍රතාව පිටුදැකීමේ සහ තිරසර සංවර්ධනය ඇති කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති සැකසීමේදී සෑම රටකටම ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඇති අයිතියට සහ නායකත්වයට ගරු කිරීම |

# 06

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 61 | 36 | 25 |
| තෘතීයික | 27 | 21 | 6 |
| ද්විතීයික | 244 | 133 | 111 |
| ප්‍රාථමික | 224 | 102 | 122 |

)2023.12.31 දිනට(

## 6.2 සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්ය

2023.12.දිනට ආයතනයේ ජ්‍යෙෂ්ඨ 31, තෘතීය, ද්විතීයික හා ප්‍රාථමික යන සියලු මට්ටම්වල සේවා සනයන්හි සේවක හිගයක් පැවතී ඇත .2 වර්ෂය තුළ මුදල් අමාත්‍යාංශය 022විසින් රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් සියලු රජයේ ආයතන වෙත ලබා දෙන ලද උපදෙස් අනුව, සේවක සංඛ්‍යා කළමනාකරණය සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමු කර තිබූ අතර, ඒ අනුව නව බඳවාගැනීම්පත් කිරීම් සිදුකිරීමකින් තොරව කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම / කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම ද පෙන්වා දී තිබුණි ඒ අනුව එම විධිවිධාන ය . වර්ෂයේ සඳහාද ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා අග්‍රාමාත්‍ය 2023 ලේකම්තුමාගේ අවධානය යොමු විය

ඒ අනුව, ස්ථාන මාරුවීම් විශ්‍රාම යාම් වැනි හේතූන් මත පුරප්පාඩු වන තනතුරු සඳහා / අනුප්‍රාප්තිකයන් ලබා ගැනීම මගින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉතා අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් සිදු කරන ලදි.

එමෙන්ම, ගරු අග්‍රාමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයේ මෙන්ම අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා අනුමත තාවකාලික කාර්යමණ්ඩලයේ තනතුරු සඳහා ද පත් කිරීම ද තනතුරු කිහිපයකට පමණක් සීමා කරන ලදි .

වැඩ අධ්‍යයනයක් සිදු කර ආයතනික සංවිධාන ව්‍යුහය සංශෝධනයට ලක් කර රාජකාරි පැවරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් හැකිතාක් රාජකාරි කටයුතු කිරීමට නැඹුරු වීම තුළින් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට කටයුතු කරන ලද අතර, ඒ අනුව ඇතිවූ සේවක හිඟය ආයතනයේ කාර්යක්ෂමතාවයට බාධා නොවන අයුරින් කළමනාකරණය කර ගන්නා ලදි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධරයන්ගේ දැනුමකුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම තුළින් , සේවයේ ,කාර්යාල කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව ඉහළ නැංවීමට අවකාශ සැලසීමත් ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් අරමුණු කර ගනිමින් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් .සඳහා නිලධරයන් යොමු කිරීමට කටයුතු කර ඇත



ඒ අනුව, 2023.01.2023 දින සිට 01.12.දින දක්වා කාල වකවානුව තුළ යොමු කර ඇති 31 .වැඩමුළු පිළිබඳ තොරතුරු පහත දැක්වේ /වැඩසටහන් /දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා

## දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්

| # | පුහුණු වැඩසටහන | ඉලක්ක ගත නිලධාරීන් | දේශීය/ විදේශීය | කාල සීමාව | සහභාගී වූ ගණන |
|---|---|---|---|---|---|
| 01. | ඵලදායිතා කටයුතු ක්‍රියාත්මක කිරීම හා නියාමනය | මාණ්ඩලික නිලධරයන් | දේශීය | 2023.02.14 | 15 |
| 02. | රජයේ ගිණුම් කටයුතු | ද්විතියික මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.02.24 | 50 |
| 03. | ඵලදායිතා සංකල්පය භාවිතය හා විගණනය | මාණ්ඩලික නිලධරයන් | දේශීය | 2023.03.02 | 15 |
| 04. | Google Workspace | සියලුම සේවා මට්ටම්වල නිලධාරීන් | දේශීය | 2023.03.08 | 55 |
| 05. | ලිපිගොනු කළමනාකරණ පද්ධතිය හා එහි නව්‍යකරණය වූ යෙදවුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව (DMS) | සියලුම සේවා මට්ටම්වල නිලධාරීන් | දේශීය | 2023.03.14 | 136 |
| 06. | Google Workspace | සියලුම සේවා මට්ටම්වල නිලධාරීන් | දේශීය | 2023.03.22 | 65 |
| 07. | විදුලි බිල අවම කිරීම සඳහා කාර්යක්ෂමව බලශක්තිය පරිභෝජනය පිළිබඳ වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් හා අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාසයේ නිලධරයන් හා නාවික හමුදා නිලධරයන් | දේශීය | 2023.03.24 | 416 |
| 08. | බලශක්ති විගණන කණ්ඩායම් සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධාරීන් | දේශීය | 2023.03.24 | 20 |
| 09. | අග්‍රාමාත්‍ය කාර්යාලයීය රාජකාරී කටයුතු ඩිජිටල්කරණය කිරීම පිළිබඳ වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධාරීන් | දේශීය | 2023.03.30 | 50 |
| 10. | මූලික ඵලදායිතා සහතිකපත්‍ර පාඨමාලාවට අදාළ ක්ෂේත්‍ර චාරිකාව - I වන කණ්ඩායම | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.03.31 | 80 |

| # | පුහුණු වැඩසටහන | ඉලක්ක ගත නිලධාරීන් | දේශීය/ විදේශීය | කාල සීමාව | සහභාගී වූ ගණන |
|---|---|---|---|---|---|
| 11. | බලශක්ති විගණන කණ්ඩායම් සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.04.04 | 20 |
| 12. | Google Spread Sheet භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.05.11 | 40 |
| 13. | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.05.11 | 36 |
| 14. | ගිනි නිවීමේ උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.06.02 | 40 |
| 15. | ධනාත්මක ආකල්ප වර්ධනය | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.06.22 | 110 |
| 16. | කාර්යාභිවර්ධනය | කා.සේ.සේවයේ හා රියදුරු සේවයේ සේවක මහතුන් | දේශීය | 2023.06.28 | 50 |
| 17. | Cyber Security Policy | මාණ්ඩලික නිලධාරීන් | දේශීය | 2023.07.10 | 21 |
| 18. | Management & Leadership | මාණ්ඩලික නිලධාරීන් | දේශීය | 2023.07.14 | 03 |
| 19 | අමුත්තන්ට සංග්‍රහ කිරීමේ ආචාර විධි | කාර්යාල සේවක සේවයේ සේවක මහතුන් | දේශීය | 2023.07.14 | 50 |
| 20 | Cyber Security | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.07.13, 20,26 2023.08.04, 24 | 92 |
| 21 | Microsoft word | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.07.19,26 2023.08.02,04 හා 08 2023.08.24 | 79 |
| 22 | Cyber Security | මාණ්ඩලික නිලධරයන් | දේශීය | 2023.08.08 | 21 |

| # | පුහුණු වැඩසටහන | ඉලක්ක ගත නිලධාරීන් | දේශීය/ විදේශීය | කාල සීමාව | සහභාගී වූ ගණන |
|---|---|---|---|---|---|
| 23 | පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ දැනුවත්කිරීම | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.08.09 - 11<br>2023.08.22 - 25<br>2023.09.05 - 07<br>2023.09.21 | 170 |
| 24 | ගිනි නිවීමේ උපකරණ භාවිතය | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.08.15 | 35 |
| 25 | රාජ්‍ය සේවයේ විනය හා කාර්ය පටිපාටි පිළිබඳ වැඩමුළුව | සහකාර ලේකම් | දේශීය | 2023.09.04 - 08 | 01 |
| 26 | ITMIS Training Program | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.09.04 - 07 | 04 |
| 27 | Awareness Program on Demand Side Management Activities for Government Buildings | සංවර්ධන නිලධාරි | දේශීය | 2023.09.06 | 02 |
| 28 | Workshop on Business Writing | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.09.11 – 13<br>2023.11.15 - 17 | 25 |
| 29 | වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුළුව | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.09.13 හා 14 | 25 |
| 30 | නවීන වාහනවල උපාංග භාවිතය හා නඩත්තුව | රියදුරු | දේශීය | 2023.09.08 හා 15 | 33 |
| 31 | Microsoft Excel | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.09.26<br>2023.10.26 | 37 |
| 32 | තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ වැඩමුළුව | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | දේශීය | 2023.10.02 | 50 |
| 33 | Workshop on Digital Procurement | මාණ්ඩලික නිලධරයන් | දේශීය | 2023.10.10 | 22 |

| # | පුහුණු වැඩසටහන | ඉලක්ක ගත නිලධාරීන් | දේශීය/ විදේශීය | කාල සීමාව | සහභාගී වූ ගණන |
|---|---|---|---|---|---|
| 34 | අන්තරායකර ඖෂධ භාවිතයේ ආදීනත්වය, ඇබ්බැහිවූවන් මුදා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.10.12 | 50 |
| 35 | Citra Innovation Lab | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.10.12 | 16 |
| 36 | සයිබර් ආරක්ෂණ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන | තො. හා ස.තා.ස. | දේශීය | 2023.10.20 | 01 |
| 37 | මාර්ග නීතිරීති හා මාර්ග ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | දේශීය | 2023.11.09 | 60 |
| 38 | ප්‍රථමාධාර පුහුණු වැඩමුළුව | සියලුම සේවා මට්ටම්වල නිලධරයන් | | 2023.11.15 | 70 |
| 39 | Executive Training Programme for Senior Government Officials - Pakistan | මාණ්ඩලික නිලධාරි | විදේශීය | 2023.02.06 - 2023.02.18 (දින 12) | 03 |
| 40 | Reducing Cyber Crime through Knowledge Exchange & Capacity Building -India | සහකාර ලේකම් | විදේශීය | 2023.02.13 - 2023.03.24 (දින 40) | 01 |
| 41 | Seminar on Poverty Alleviation and Sustainable Development for B&R Countries - China | සහකාර ලේකම් | විදේශීය | 2023.04.04 - 2023.04.17 (දින 14) | 01 |
| 42 | Seminar on Implementing 2030 Agenda for Sustainable Development for Developing Countries Poverty Alleviation – China | සංවර්ධන නිලධාරි | විදේශීය | 2023.04.04 - 2023.04.17 (දින 14) | 01 |
| 43 | In-Person Capacity Building Training Opportunities for Senior and Mid-Career Officials - China | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | | 2023.10.14 – 2023.10.24 (දින 10) | 08 |
| 44 | In-Person Capacity Building Training Opportunities for Senior and Mid-Career Officials - China | විධායක මට්ටම/ තෘතීය මට්ටම/ ද්විතීය මට්ටමේ නිලධරයන් | | 2023.12.15 – 2023.12.23 (දින 08) | 07 |

# 07

# අනුකූලතා වාර්තාව

## 7.1. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශගිණුම් නියමිත / දිනය ඉදිරිපත් කර තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් වාණිජ අත්තිකාරම්)ගිණුම්( | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/අනුව 2018 ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනපුද්ගල පඩිනඩි / කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **2.5** | සියලුම මාසික ගිණුම් සාරාංශ )CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **2.6** | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **2.7** | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.8** | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.9** | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.10** | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **2.11** | උප පත්‍රිකා පොත් ලේඛනය )GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| **3.1** | මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| **3.2** | මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| **3.3** | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| **3.4** | 2014.05.171 දිනැති අංක 11/දරණ 2004 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| **4.1** | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| **4.2** | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| **4.3** | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට )NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු .රෙ.134)2 (DMA/1-අනුව 2019, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | දරණ ජාතික විගණන 19 අංක 2018 40 පනතේ(4) උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-අනුව 2019, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන 04 තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8.1** | අංක 01/ දරන වත්කම් 2017කළමනාකරණ චක්‍රලේඛයේ වන පරිච්ඡේදය අනුව 07, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **8.2** | ඉහත සඳහන් චක්‍රලේඛයේ වන 13 පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| **8.3** | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/අනුව 2016, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **8.4** | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| **8.5** | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු .රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| **9.1** | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **9.2** | වාහන ගර්හිත වී මාස කට වඩා අඩු 06 කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| **9.3** | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **9.4** | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු .රෙ.103,104 , ප්‍රකාරව 110 හා 109 කටයුතු කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.2016 දිනැති අංක 29/දරන 30 3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ. ඡේදයේ 1 සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10 | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කිරීම | අදාළ නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| 11 | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු .රෙ.94)1ප්‍රකාරව (, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | | |
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| 13 | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු .රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු .රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු .රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කිරීම | අදාළ නොවේ | | |
| 15.3 | මු .රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09. දිනැති 2017MSD චක්‍රලේඛ අංක 04/ප්‍රකාරව සියලුම වාර්තා 2017 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **17.1** | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **17.2** | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසාචෝදනා පල කිරීමට පහසුකම් / සලසා තිබීම | අනුකූල වේ | | |
| **17.3** | තොරතුරු දැනගැනීමේ පනතේ වන හා 08 වන වගන්ති ප්‍රකාරව වසරකට 10 දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| **18.1** | අංක 05/05 හා 2008/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසිසේවාලාභී / ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| **18.2** | එම චක්‍රලේඛයේ 2.ඡේදය පරිදි 3, පුරවැසිසේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය / කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට .තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| **19.1** | 2018.01.දිනැති රාජ්‍ය පරිපාලන 24 02 චක්‍රලේඛ අංක/ 02 ඇමුණුම 2018 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19.2** | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **19.3** | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම හි 01 දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| **19.4** | ඉහත චක්‍රලේඛයේ 6.ඡේදය ප්‍රකාරව 5 මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| **20.1** | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# 08

# විගණකාධිපති නිරීක්ෂණ

## 8.1 විගණකාධිපති නිරීක්ෂණ

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } TPD/C/23/46/PMO/FA    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 මැයි 22 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
අග්‍රාමාත්‍ය කාර්යාලය

**ශීර්ෂය 002 – අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 002 - අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

2

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද අග්‍රිම වටිනාකම රු.1,042,000,000 ක් වූ අතර භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අග්‍රිම වටිනාකම රු.1,062,338,000 ක් වූයෙන් අග්‍රිම සැලසුම හා ඉල්ලුම් කළ වටිනාකම අතර රු.20,338,000 ක විචල්‍යතාවයක් නිරීක්ෂණය විය.

### 2.2 වියදම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රතිපාදන මාරු කිරීම

(i) වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මු.රෙ.66 මගින් වැය විෂයයන් 12 ක හා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් වැය විෂයකට ප්‍රතිපාදන සලසාගෙන සියයට 3 සිට 200 දක්වා ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 20 ක ලයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 586 අතර ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන් සඳහා මු.රෙ.66 මගින් මාරු කර තිබුණි.

(ආ) ප්‍රතිපාදන උපයෝජනය

(i) වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් වෙනත් වැය විෂයකට මු.රෙ.66 අනුව ප්‍රතිපාදන මාරු කළ පසුද වැය විෂයයන් දෙකක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 32 දක්වා පරාසයක් තුල වැය නොකර ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් හතරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 61 දක්වා පරාසයන් තුල ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

4

## 2.3 බැඳීම් හා බැරකම්

අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත්ව තිබූ විජේරාම පිහිටි නිල නිවසේ අළුත්වැඩියාව සඳහා 2021 වර්ෂයේ සිට සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් ලබාගත් ගොඩනැගිලි ද්‍රව්‍ය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ගෙවිය යුතු මුදල රු.84,634,220 ක් බව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව තහවුරු කළ ද අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් යටතේ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ගෙවිය යුතු ශේෂයක් දක්වා නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| (i) | මු.රෙ.104(3) ප්‍රකාරව | 2023 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවේ හා අවසන් වාර්තාවල පිටපතක් විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ.104(4) ප්‍රකාරව | අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් විගණන දිනය වන 2024 අප්‍රේල් 09 වන දිනය වන විට අනතුර සිදු වී මාස 03 ක් ඉක්මවා ඇති වාහන හයක් සඳහා රෙගුලාසි පරිදි කටයුතු කරමින් පවතින බව නිරීක්ෂණය විය. |
| (iii) | මු.රෙ. 115(1) ප්‍රකාරව | මුදල් වර්ෂයක් ඇතුළත ඉදිරිපත් කෙරෙන හිමිකම්පෑම් වලට හැකිතාක් දුරට ඒ මුදල් වර්ෂය ඇතුළතදීම ගෙවා බේරුම් කළ යුතු අතර එසේ නොහැකිවන අවස්ථා හැකිතාක් දුරට අඩු කිරීමට සෑහෙන විශේදයකින් හා දුරදර්ශීභාවයකින් ක්‍රියා කළයුතු වුවද නියැදි පරීක්ෂාවේදී අවස්ථා 04 ක රු.1,842,254 ක් ගෙවීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | මු.රෙ. 315 ප්‍රකාරව | ඇප තැබිය යුතු නිලධාරීන් අවශ්‍ය ඇප තබන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියකු විසින් වග බලාගත යුතු වුවත් 2023 වර්ෂයේදී අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරින් 04 ක් හා රියදුරන් 38 දෙනෙකු ඇප තැබීමක් කර නොතිබුණි. |
| (v) | මු.රෙ.892 ප්‍රකාරව | ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් සෑම වර්ෂ තුනක් අවසානයේදී පසුව යෙදෙන පෙබරවාරි 15 වැනි දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඇප සංශෝධිත නිලධාරීන්ගේ වාර්තාවක් 2024 පෙබරවාරි 21 තෙක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) | 2010 ජූලි 09 දිනැති අංක සී/ඒ/1/1/16/1 නිතිය දරණ ජනාධිපතිලේකම්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව | රජයේ නිලධාරියකු විදේශ සංචාරයේ යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් පසු දින 07 ක් ඇතුළත එම චක්‍රලේඛයේ (ඊ) ඇමුණුමේ ඇති ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් විදේශ ගමන අනුමත කර නිලධාරියා වෙත ලබාදිය යුතු වුවත් 2023 වර්ෂය තුලදී අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් විදේශ පුහුණු හා සංචාර සඳහා සහභාගිවූ නිලධාරීන් ඉදිරිපත් කර තිබූ වාර්තා එම ඇමුණුම ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. |
| (vii) | ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයෙහි 9.6 වගන්තිය ප්‍රකාරව | උණුසුම් ඇඳුම් දීමනාව වශයෙන් ලද මුදල පිටරට නැවතීම සඳහා තමාට අවශ්‍ය ඇඳුම් පැළඳුම් මිලදී ගැනීමට වියදම් කළ බවට සහතිකයක් හැකිතාක් ඉක්මනින් නිලධාරියා විසින් ඉදිරිපත් කළ යුතු වුවත් නිලධාරීන් 15 දෙනෙකු විසින් 2024 පෙබරවාරි 24 දින වන විටත් එම සහතික ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

(අ) 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබී තිබූ මහජන ඉල්ලීම් 21,878 ක් සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ මහජන සබඳතා අංශය පසුවිපරම් කරන අතර දීර්ඝ කාලයක් තුල විසඳී නැති ගැටළු සඳහා රැස්වීම් හා සාකච්ඡා පවත්වා අවසන් කර ඇති ගැටළු සංඛ්‍යාව 685 ක් පමණක් විය.

6

(ආ) 2023 ඔක්තෝබර් 23 දින පැවති ජාතික සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාල සාකච්ඡාව වෙනුවෙන් අනු කමිටුවක් පත්කොට එමගින් ඉදිරිපත් කරනු ලබන ක්‍රමවේද හා නිර්දේශ ඇතුළත් වාර්තාවට සමගාමීව ඉදිරි වර්ෂ 03 ඇතුළත ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුත්ත අවසන් කර නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

(අ) අග්‍රාමාත්‍ය කාර්යාලය සතුව වාහන 138 ක් ඇති අතර එයින් වාහන 07 ක් වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදී තිබුණි. වෙනත් රාජ්‍ය ආයතන වලින් වාහන 19 ක් කාර්යාලයේ කටයුතු සඳහා ලබාගෙන තිබුණි. මෙම වාහන සම්බන්ධව සිදු කළ විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 19 න් වාහන 10 ක් විධිමත් පවරා ගැනීමකින් තොරව වර්ෂ 1 ත් වර්ෂ 8 ත් දක්වා කාල සීමාවක් තුල අග්‍රාමාත්‍ය කාර්යාල කටයුතු සඳහා භාවිතා කර තිබූ අතර එම වාහන කාර්යාලයට පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිමකර නොතිබුණි.

(ii) අග්‍රාමාත්‍ය කාර්යාලය සතු වාහන 07 ක් නැවත ඒවා අග්‍රාමාත්‍ය කාර්යාලයට ලබා දිය යුතු දිනයක් නිශ්චිතව සඳහන් නොකර අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වෙත තාවකාලිකව පවරා දී තිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) KJ 2693 දරන රථයේ 2023 මාර්තු 16 දින සිදුවූ අනතුරට අදාලව මූලික විමර්ශනය සිදු කිරීමට පරිපාලන නිලධාරිනියක් 2023 ජූලි 18 දින පත්කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට අනතුර සිදුවී මාස තුනක් ඉක්මවා ඇතත් ඒ සම්බන්ධව කටයුතු නිමකර නොතිබුණි. මෙම අනතුර වාහන ලොග් පොතේ ද සටහන් කර නොතිබුණි.

(ඇ) 2022 ජූලි 09 දින රටේ ඇතිවූ කළහකාරී සිදුවීම් නිසා හානියට පත්වූ CAV – 8105 දරන රථය ගර්හිත කර ඇති අතර ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් අනුව, ඒ සඳහා රක්ෂණයෙන් සම්පූර්ණ වන්දි මුදලම ලබානොගෙන රු.මිලියන 200 ක් 2022 නොවැම්බර් 23 දිනදී ලබාගෙන තිබුණි. මෙම රථය තවදුරටත් ධාවනයේ යෙදවිය නොහැකි අතර එම වාහනයේ අපහරණ කොටස් මෙම වාහනයට සමාන තවත් අධි ආරක්ෂිත රථයට යොදාගත හැකි බැවින්

රථය කාර්යාලයේ රඳවාගෙන තිබුණු අතර අදාල රථයේ මූල්‍ය වටිනාකම තවදුරටත් මූල්‍ය නොවන වත්කම් වල ප්‍රවාහන උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඈ) PG – 0608 දරන රථය 2023 ජනවාරි 19 දින අනතුරට භාජනය වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක් සිදු කර නොතිබුණ අතර මෙම හානිය පිළිබඳ මුදල් රෙගුලාසි 104 පරිදි මූලික විමර්ශන කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිම කර නොතිබුණි.

(ඉ) අග්‍රාමාත්‍ය කාර්යාලය කටයුතු සඳහා භාවිතා කළ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් කොළඹ 07, ග්‍රෙගරි මාවත, අංක B 89 බංගලාව හා කොළඹ 07 විජේරාම මාවතේ අංක බී, 109 දරන රජයේ බංගලාව 2022 සැප්තැම්බර් 22 දින සිට අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු සඳහා භාවිතයට නොගෙන පවතින අතර එම නිවාසය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල අමාත්‍යාංශයට නැවත භාරදීමක් සිදුකර නොතිබුණි.

## 3.3 හානි හා පාඩු

(අ) හානි පාඩු ලේඛනයට අනුව වාහන හයක අනතුරු සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අලාභ අයකරගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

(ආ) 2022 වර්ෂයේදි අරලියගහ මන්දිරය හා මහජන සම්බන්ධතා අංශයට සිදුවූ අලාභය රු.8,437,438 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයේ රු.8,342,689 ක් ලෙස දක්වා තිබුණි.මේ හේතුවෙන් රු.94,750 ක් අඩුවෙන් අලාභ හා හානි දක්වා තිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

(අ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය වියදම් ඉතා අත්‍යාවශ්‍ය සේවාවන්ට පමණක් යොදාගත යුතු බවත්, ගොඩනැගිලි ඉදිකිරීම් හා කුළියට ගැනීම නැවැත්වීම දැඩිව අනුගමනය කළ යුතු බවත්, සඳහන් කර තිබියදීත් අග්‍රාමාත්‍ය කාර්යාල නිල නිවසේ නඩත්තු හා අළුත්වැඩියා සඳහා 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් රු.181,520,617 හා රු.38,883,447 ක් වැයකර තිබු බව නිරීක්ෂණය විය.

8

(ආ) අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු අනුව විජේරාම නිල නිවසේ අලුත්වැඩියා කටයුතු සඳහා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දරා තිබුණු සමස්ථ වියදම රු.472,529,073 වූ අතර ඉන් රු.456,032,672 ක් සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ගෙවා තිබුණි. සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ තොරතුරු අනුව ඉහත ගෙවා ඇති මුදල් වෙනුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත නිකුත් කර තිබූ ඉන්වොයිසි වල මුළු වටිනාකම රු.639,218,155 ක් වූයෙන් ඉන්වොයිස් වටිනාකම් හා ගෙවා ඇති මුදලේ රු.183,185,483 ක නොගැළපීමක් නිරීක්ෂණය විය.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

කාර්යාලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 556 ක් වූ අතර ඉන් තනතුරු 264 ක් පුරප්පාඩුව පැවතුනි. සමාලෝචිත වර්ෂයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 25 ක් පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය. තනතුරු සමාලෝචනය කර පුරප්පාඩු පිරවීමට හෝ තනතුරු යටපත් කිරීමට සමාලෝචිත වර්ෂයේ දී පියවර ගෙන නොතිබුණි.

ඩී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

9